# I. 1964 ආර්ථික ප්‍රශ්න හා ප්‍රතිපත්ති.

## හැඳින්වීම.

ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය අනුව, 1964 වසර 1963 ට වඩා තරමක් හොඳ වසරක් විය. 1963 දී දළ දේශිය නිෂ්පාදිතය, මූර්ත වශයෙන් වැඩිවී ඇත්තේ සියයට 1·9 කින් පමණෙකි. එහෙත් ඒකජන මූර්ත නිෂ්පාදිතය, සියයට 0·6 කින් පහළ වැටිණ. එහෙත් 1964 දී මූර්ත දළ දේශිය නිෂ්පාදිතය, සියයට 4·5 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, ඒකජන මූර්ත නිෂ්පාදිතය සියයට 2·1 කින් වැඩි වී ඇත. අපනයනය කැරෙන භෝග, පොල් සහ රබර් වල සැලකිය යුතු වැඩිවීමෙක් ඇති විය. එසේම වී නිපැයුම හා කාර්මික නිෂ්පාදනය ඇතුළුව දේශීය අංශයේ ශුඞ නිපැයුම් වැඩිවීමක් දක්නට ලැබුණි. 1964 දී වර්ධන වේගයේ සියයට ගණන වැඩිවීම, 1963 දී අර්ථ ක්‍රමයෙහි ඇති වූ ඌණ වර්ධනය නිසා පිළිබිඹු වන්නකි.

ලංකාවේ බාහිර ගෙවුම් ගිණුම් කෙරෙහි ඇති වූ පීඩනය 1964 දීත් නොකඩවාම තදින් දැනෙන්නට විය. 1963 දී තියුණු ලෙස සියයට 9 කින් අඩු වී ගිය වෙළෙඳ අනුපාතය 1964 දී තවදුරටත් සියයට 3 කින් අඩු විය. ආනයන ඉතා දැඩි ලෙස සීමා කළ ද, ලංකාවේ ජංගම ගිණුමෙහි, හිඟයක් ඇති වූයේ විදේශිය වත්කම් රුපියල් කෝටි 5·10 අඩුවූ අතර කෙටි කාලීන විදේශිය වගකීම් රුපියල් කෝටි 4·00 කින් වැඩිවිය. විශේෂයෙන් සීනි ඇතුළුව, ආහාර ආනයන වල ලෝක වෙළෙඳ පොළේ මිල වැඩිවීම 1964 දී ලංකාවේ ගෙවීම් දුෂ්කරතා ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ආනයන ආහාර වල මිල අධික වීම නිසා රජයේ අය-වැය විල ප්‍රාසාරණාත්මක හිඟය අඩුකරලීමද කළ නොහැකි විය. 1962/63 මුදල් වර්ෂයේදී රු. කෝටි 16·20 ක් වූ ප්‍රාසාරණාත්මක හිඟය හා සසඳා බලන විට 1963/64 දී එය රු. කෝටි 16·29 ක් වූ බව පෙනේ. 1963/64 දී ආහාර ආධාරය සඳහා වූ වියදම රුපියල් කෝටි 13·94 කින් වැඩිවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ සීනි වලින් ලැබෙන ලාභය රුපියල් කෝටි 7·95 කින් වැඩිවීමය. පෞද්ගලික අංශයට හා රජයේ සමායතන වලට දෙන ලද වෙළෙඳ බැංකු ණය රුපියල් කෝටි 9·2 කින් වැඩිවීම 1964 දී මුදල් සැපයුම ප්‍රාසාරණය කිරීමෙහි ලා හේතු විය. 1964 දී මුළු මුදල් සැපයුම රුපියල් කෝටි 11·58 කින් හෙවත් සියයට 7·7 කින් වැඩිවිය. 1963 දී වැඩි වූ ප්‍රමාණය රුපියල් කෝටි 16·33 ක් හෙවත්, සියයට 12·2 ක් විය.

ආනයන සීමාකිරීමත් සමග මූල්‍ය අංශයේ ඇතිවූ ප්‍රාසාරණාත්මක බලපෑම සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි නොකඩවාම බලපෑමක් ඇති කළේය. මෙයට අමතරව නොයෙකුත් වර්ගයන්ගේ භාණ්ඩ සැපයුමේද, හිඟයක් ඇතිවිය. විදේශීය විනිමය දුෂ්කරතා නිසා සංවර්ධන වේගය වැඩි කිරීමට පමණක් නොව පවත්නා නිෂ්පාදන ශක්තිය සම්පූර්ණයෙන් වැඩට ගැනීමට අවශ්‍ය වන අමු ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ අමතර කොටස් ගෙන්වා ගැනීමට ලංකාවේ ඇති හැකියාවද සීමා විය.

විශේෂයෙන්ම වේගයෙන් වැඩිවී යන ජනගහනය අනුව සලකන විට පසුගිය කාලය තුළදී ලංකාවේ ඇතිවූ ආර්ථික වර්ධනය කෙසේවත් ප්‍රමාණවත් නොවේ. ජීවන තත්ත්වය නගා සිටුවීමට සහ වැඩී එන ජනගහනයට රැකියාවල් සපයාදීමට ලංකාවේ ආර්ථික වර්ධන වේගය වහාම වැඩිකළ යුතුව ඇත. යුද්ධයෙන් පසු කාලයේදී දකින්නට ලැබුන බලපෑම් අනුව බලන විට

ආනයන කිරීමේ හැකියාව වර්ධනය වී නොමැති නිසා මේ ඉලක්කයට පැමිණීමට ලංකාවට ඇති හැකියාව සීමාවිය හැකිය. එම නිසා ලංකාවේ ප්‍රතිපත්තිය විය යුත්තේ මූල්‍ය අංශයේ ඇති අසමතුලිතතාවය නැති කිරීම සහ අපනයනය වැඩි කිරීමෙන් බාහිර ගෙවුම් තත්ත්වය ශක්තිමත් කර ගැනීමත්, හැකි අවස්ථාවල ආනයන ආදේශයත්, පිටරට ප්‍රාග්ධන සම්පත් ගලා ඒම වැඩිදියුණු කර ගැනීමත්ය. එසේම හැකි පමණින් පාරිභෝජනය වැඩිවීම සීමා කොට වැඩි වැඩියෙන් සම්පත් මාර්ග අයෝජන කෙරෙහි යෙදවීමට ද බලාපොරොත්තු විය යුතුය.

පළමුවෙනි කොටසෙහි මීළඟට එන පිටු වලින් 1964 ආර්ථික වර්ධනය ගැන කෙටි සාරාංශයක් දක්වා ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි බලපාන මූලික බලවේගයන් සහ ප්‍රශ්න ගැන විග්‍රහයක්ද ලංකාවේ මුදල් හා මූල්‍ය කටයුතු පිළිබඳ අත් දැකීම්ද සාකච්ඡාවේ. මූල්‍ය පිස්කල් කටයුතු සම්බන්දයෙන් ඇති වූ වෙනස්කම් වල වැටිසනක් සහ 1964 ලංකාවේ බාහිර ගෙවුම් ශේෂ තත්වය පිළිබඳ විස්තරයක් මේ කොටසෙහි ඊළඟට දක්වා ඇත. 1964 ලංකාවේ අර්ථ ක්‍රමයෙහි නොයෙකුත් අංශ පිළිබඳ වඩාත් විස්තරාත්මක තොරතුරු දෙවැනි කොටසේ දක්වා ඇත.

## (1) 1964 ආර්ථික වර්ධනය

තාවකාලික ඇස්තමේන්තු අනුව දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා මිල අනුව 1964 දී සියයට 6·0 කින්ද, ස්ථාවර මිල අනුව සියයට 4·5 කින්ද වැඩිවී ඇත. ඒකජන වශයෙන් බලන කල එනම් වැඩිවූ ජනගහනයට ඉඩහැරීමෙන් පසු, එක්කෙනෙකුට වැටෙන නිෂ්පාදිතය මුදල් වශයෙන් සියයට 3·5 කින් වැඩිවූ අතර, මූර්ත වශයෙන් සියයට 2·1 කින් වැඩීවී ඇත.

1964 දී මූර්ත නිෂ්පාදිතය වැඩිවූ ප්‍රමාණය සියයට 4·5 ක් විය. මෙය පසුගිය වසරේ ඇති වූ සියයට 1·9 යේ වර්ධනයට වඩා සැලකිය යුතු දියුණුවකි. 1964 ඇති වූ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන අංශයේ නිපැයුම සියයට 7·0 කින් වැඩිවීමය. දේශිය අංශයේ ශුඩ නිපැයුමේ වැඩිවීම මෙයට අඩු වූයේ සියයට 3·3 ක් විය. අපනයන අංශයේ වැඩිවීමෙන් පොල් සහ රබර් නිෂ්පාදනයේ ඇතිවූ වැඩිවීම පිළිබිඹු වෙයි. තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 0·3 කින් හෙවත් සියයට 0·6 කින් පහළ වැටුනු අතර, පොල් සහ රබර් නිෂ්පාදනය සියයට 17·3 කින් සහ සියයට 6·5 කින් පිළිවෙළින් වැඩිවිය. දේශීය අංශය ගෙන බලන කල කර්මාන්ත, වී නිෂ්පාදනය සහ සේවාවන් වල වර්ධනයක් දක්නට ලැබේ. වී නිෂ්පාදනය බුසල් කෝටි 0·13 කින් හෙවත් සියයට 2·6 කින් වැඩිවී ඇත. මෙය 1963 ඇති වූ වර්ධනය වන, බුසල් කෝටි 0·11 හෙවත් සියයට 2·3 ට වඩා මඳක් වැඩිය.

පවත්නා වෙළෙඳ මිල අනුව දළ දේශිය වියදම සියයට 7·2 කින් වැඩිවිය. දළ දේශීය වියදම් වෙළෙඳ මිල අනුව වූ දළ දේශීය නිෂ්පාදිතයට වඩා රුපියල් කෝටි 18·8 කින් වැඩිවිය. මේ වෙනස, රටේ විදේශිය වත්කම් අඩු කර ගැනීමෙන් සහ විදේශීය වගකීම් වැඩිකර ගැනීමෙන් බොහෝ දුරට පියවා ගනු ලැබීය.

1964 දී පෞද්ගලික පාරිභෝජන වියදම සියයට 8·8 කින් වැඩිවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ආනයන සඳහා වූ වියදම් වැඩිවීමය. මුළු ප්‍රාග්ධන සම්පාදනය සියයට 1·7 කින් අඩු විය. 1963 දී අඩුවූ ප්‍රමාණය සියයට 3·0 ක් විය. 1964 දී මුළු ප්‍රාග්ධන සම්පාදනය අඩුවීමට හේතු වූයේ තොග අඩුවීමය. ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 3·2 කින් වැඩිවිය. ස්ථාවර ප්‍රාග්ධන

සම්පාදනයේ වැඩිවීම මුළුමනින්ම ඇතිවූයේ පෞද්ගලික [1] අංශයෙහිය. රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට **11.3** කින් පහත වැටිණ. වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් බලන කල 1963 දී සියයට **13.8** ක් වූ ප්‍රාග්ධන සම්පාදනය 1964 දී සියයට **13.5** දක්වා මඳක් අඩුවිය.

## (2) ආර්ථික වර්ධනය සඳහා බලාපොරොත්තු - ආනයන ශක්තිය සම්බන්ධ වූ ප්‍රශ්න

ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයේ ඇතිවූ සාපේක්ෂිත පසු බැස්මෙන් පුනරුත්-ථාපනයට පැමුණුනද; 1964 දී ලංකාවේ ඇතිවූ අත්දැකීම්වලින් රටේ වඩාත් මූලිකවූද දිගුකාලීනවූද ගැටළු කිහිපයක් ඉස්මතු වී පෙනෙන්නට විය. මෑත වර්ෂවල දී ඇතිවූ පිස්කල් හා මූල්‍ය ප්‍රාසාරණය පිළිබඳව පසුගිය මහබැංකු වාර්තාවලින් අවධානය යොමු කරවන ලදී. මෙම ප්‍රාසාරණයෙන් රටේ විදේශීය සංචිත හා දේශීය මිල මට්ටම කෙරෙහිද බලපෑමක් ඇතිවිය. ලංකාවේ වෙළෙඳ අනුපාතය නොකඩවාම අවාසි සහගත තත්ත්වයක පැවතීමෙන් එකී බලපෑමේ ප්‍රතිවිපාක තව තවත් උග්‍ර විය. එසේ වුවද, ලංකාව දැනට මුහුණ පා ඇති දුෂ්කරතා හුදෙක් මූල්‍ය හා පිස්කල් ප්‍රාසාරණය අඩු කිරීමෙන් පමණක් සමථයකට පත්කළ හැක්කේ නොවේ. විදේශීය සංචිත පිරිහීයාම හේතුකොට ගෙන වඩාත් මූලික ලක්ෂණයන්ගෙන් හෙබි ගැටළු කිහිපයක් මතුවී පෙනින. එනම් සීග්‍ර ආර්ථික වර්ධනයක අවශ්‍යතාවය වටහා ගැනීමට අවශ්‍ය වන අන්දමේ, විශේෂයෙන් ආනයන භාණ්ඩ ඇතුළත් සැපයීම්වල ප්‍රමාණවත්භාවයට සම්බන්ධිත ගැටළුය. දේශීය මිල මට්ටම කෙරෙහි ඇතිවී තිබෙන පීඩනය ලිහිල් කිරීම හා මූල්‍ය ක්ෂේත්‍රයෙහි සමතුලිතතාවය ඇති කිරීම සඳහා මූල්‍ය හා පිස්කල් ප්‍රාසාරණ ප්‍රවනතාවය අඩු කිරීම අත්‍යාවශ්‍ය වෙයි. එහෙත් ලංකාවේ ආර්ථික සංවර්ධන වේගය ප්‍රමාණවත් මට්ටමකට නගාලීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබාගැනීමට නම් ඉහතකී ක්‍රියාමාගීයන් සමග දිගුකාලීන මෙන්ම කෙටිකාලීන වෙනත් පියවරවල් කිහිපයක් ගතයුතු වෙයි.

1963 දී ට වඩා ආනයන පරිමාවක් ලබාගැනීමට 1964 දී ලංකාවට හැකි විය. එහෙත්, මෙය කළ හැකි වූයේ ලංකාවේ විදේශීය සංචිත තව දුරටත් අඩු කිරීමෙන් හා කෙටි කාලීන වගකීම් වැඩිකර ගැනීමෙනි. එසේ වුවද ආනයන ගලා ඒම වැඩි වුවද ලංකාවේ අවම ආනයන අවශ්‍යතාවයන් සපුරාලූයේ යන්තමිනි. ඇරඹිගන එන කර්මාන්ත අංශයෙහි නිෂ්පාදනය සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි වන්නට වූ නමුදු අංශ කිහිපයකම භාණ්ඩ හිඟවීම හා දුබලවීම දක්නට ලැබිනි. විශේෂයෙන්ම, 1964 අවසාන භාගයේදී කාර්මික අමුද්‍රව්‍ය හා උපකරණ හිඟයක් සහ කාර්මික ව්‍යවසායන් කිහිපයක් විසින් නිෂ්පාදන ශක්තිය අඩුවෙන් යෙදවීමක් දක්නට ලැබුනි. විදේශීය විනිමය හිඟවීම හේතුකොට ගෙන 1964 දී නව කාර්මික වර්ධනයේ වේගය පවත්වාගෙන යාම සඳහා ලංකාවට ඇති ශක්තිය කෙරෙහි තර්ජනයක්, එල්ලවන බවට පැහැදිලි ලකුණු පෙනෙන්නට විය. එම විදේශීය විනිමය හිඟය වූ කලී අළුත් ක්‍රියා ආරම්භ කිරීම හා ඒවාට අවසරදීම අඩුකරලීමට සමත්වූ හිඟයකි. තවද අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය දැඩි ලෙස සීමාකර තිබියදීත් විනිමය හිඟය නිරායාසයෙන්ම මතුවී පෙනෙන්නට විය.

ලංකාවේ මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇත්තේ රටට අවම වශයෙන් අවශ්‍ය ආනයන ප්‍රමාණයට සරිලන අන්දමින් ලංකාවේ මූලික "ආනයන ශක්තිය"

---

(1) රජයේ සමායතනද ඇතුළත් වන සේ අර්ථ නිරූපනය කොට ඇත.

පුලුල්කර ගැනීමට අසමත්වීම හේතු කොට ගෙනය. "ආනයන ශක්තිය" වැඩි කර ගැනීමට නොහැකිවීම වූකලී යුද්ධයෙන් පසු කාලච්ඡෙදය මුලුල්ලේ විටින් විට ඇතිවූ වෙනස්කම් තිබුනද, වැඩී ආ හැඩගැස්මේ ප්‍රතිඵලයකි. එහෙත් මෙසේ වැඩී ආ හැඩගැස්මේ සම්පූර්ණ විපාක දැඩි ලෙස දැනෙන්නට වූයේ පසුගිය අවුරුද්දේදී නැතහොත් පසුගිය අවුරුදු දෙක තුලදීය. ලංකාවේ ආනයන ශක්තිය තීරණය වනුයේ එක් අතකින් අපනයන මාර්ගයෙන් ලබාගන්නා විදේශිය මුදල් හා පිටරටින් ගලාඑන ප්‍රාග්ධන ප්‍රමාණය හා අනෙක් අතින් ආනයන මිල මට්ටම අනුව තීරණය කැරෙන, එකී ලැබීම්වල ක්‍රය ශක්තියේ ප්‍රමාණය අනුවය. එබැවින් අපනයන නිෂ්පාදනය පුලුල් කිරීමට උත්සාහ දැරීමෙන් පමණක් රටේ ආනයන ශක්තිය වැඩිකිරීමට නුපුළුවන. එසේම එය අපනයන ආනයන මිල වෙනස්වීම, එනම්, වෙළෙඳ අනුපාතයේද ප්‍රතිඵලයක් වන්නේය. ඇත්ත වශයෙන්ම, ලංකාවේ ආනයන ශක්තිය සෑහෙන තරම වැඩි නොවීම කෙරෙහි විදේශිය මිලෙහි (අපනයන මෙන්ම ආනයන වලද) ඇතිවූ අවාසිදායක වෙනස්වීම් ද තරමක් දුරට හේතු විය. එසේ අවාසිදායක අන්දමින් මිල වෙනස්වීම නිසා, අපනයන නිෂ්පාදිත නිමැවුම වැඩි කිරීමේ මාර්ගයෙන් අපනයන ඉපැයීම් වැඩි කිරීමට ලංකාව දැරූ උත්සාහයන් බොහෝ සෙයින් අඩපන වූයේය. 1954 සිට 1963 දක්වා වූ දස අවුරුදු කාලය තුළදී ලංකාවේ ප්‍රධාන අපනයන නිෂ්පාදිතය වන තේ අපනයන පරිමාව සියයට 3·1 ක සාමාන්‍ය වාර්ෂික වැඩිවීම් අනුපාතිකයකින් සීග්‍ර ලෙස වැඩි කිරීමට හැකි විය. 1964 වර්ෂය, තේ අපනයන පරිමාව වැඩි නොවූ විශේෂ වර්ෂ අතුරින් එකකි. තවද, නැවත වගා කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ පුලුල් ව්‍යාපාර මාර්ගයෙන් රබර් හා පොල් කර්මාන්ත වල නිෂ්පාදන ශක්තිය වැඩි කර ගැනීමට ද ලංකාව උත්සාහ දැරුවේය. එහෙත්, ලංකාවේ අපනයන වල ක්‍රය ශක්තිය වැඩි වූයේ අපනයන පරිමාව වැඩිවීමේ වේගයට වඩා ඉතාමත් අඩු වේගයකිනි. මේ අනුව 1948 හා 1964 අතර, කාලය තුළදී ලංකාවේ මුළු අපනයන පරිමාව සියයට 2·7 ක සාමාන්‍ය වාර්ෂික අනුපාතිකයකින් වැඩිවූයේය. එහෙත් මෙම අපනයන වල ක්‍රය ශක්තිය හෙවත් ආනයන ශක්තිය වැඩිවූයේ සියයට 1·6 ක සාමාන්‍ය වාර්ෂික අනුපාතිකයකින් පමණි. අපනයන පරිමාව වැඩිවීමේ වේගය ජනගහනයේ වර්ධන වේගයට වඩා අඩු වූ අතර, ආනයන ශක්තිය වැඩිවීමේ වේගයද ජනගහනය වැඩිවීමේ වේගයට වඩා සැලකිය යුතු අන්දමින් අඩුවිය. මේ හේතු කොට ගෙන, එකී කාලච්ඡෙදය තුළදී ඒකජන ආනයන ශක්තිය සීඝ්‍රයෙන් පහළ වැටින. මෙය වූ කලී විදේශිය සංචිත පාච්ච්වියෙන් හෝ විදේශිය ප්‍රාග්ධන ගලා ඒමෙන් සමහන් නොකළහොත් පුද්ගලයකුට ලැබෙන ආනයන සැපයුම් පරිමාව පහළ වැටීමට තුඩුදෙන සුලු තත්ත්වයකි.

සංඛ්‍යා සටහන I – 1

**අපනයන පරිමාව හා ආනයන ශක්තිය(1) පිළිබඳ දර්ශක අංක**

**(වාර්ෂික සාමාන්‍යය)**

පාද වර්ෂය 1948=100

| | අපනයන පරිමාව | ආනයන ශක්තිය | ඒකජන අපනයන පරිමාව | ඒකජන ආනයන ශක්තිය |
|---|---|---|---|---|
| 1948–51 .. .. .. | 112 | 108 | 107 | 103 |
| 1952–55 .. .. .. | 119 | 112 | 103 | 97 |
| 1956–60 .. .. .. | 134 | 122 | 96 | 94 |
| 1961–64 .. .. .. | 144 | 129 | 99 | 88 |

(1) ආනයන ශක්තිය යනු අපනයන වල ක්‍රය ශක්තිය ලෙස අර්ථ නිරූපනය කැරේ.

$$\frac{\text{අපනයන වටිනාකම}}{\text{ආනයන මිල දර්ශකය}} \text{ X } 100$$

ඇත්ත වශයෙන්ම ආනයන භාණ්ඩ හිඟයක් ඇතිවී ඒකජනක ආනයන සැපැයුමේ පහළ වැටි ගෙන යන හැඩ ගැස්ම ඉතාමත් මෑත කාලයක් වන තුරුම ප්‍රකට නොවූයේ විදේශිය සංචිත අඩු කිරිමේ මාර්ගයෙන් වැඩි ආනයන පරිමාවක් ගෙන්වා ගැනීමට ලංකාවට හැකිවූ බැවිනි. වෙනත් ආකාරයකින් කිවහොත්, 1957 සිට 1960 දක්වා වූ කාලච්ඡේදය තුළදී විදේශිය සංචිත පාවිච්චි කිරීම නිසා ආනයන ශක්තිය පිරිහීයාමේ හැඩ ගැස්ම යටපත් කර "පමණ ඉක්මවා ජීවත් වීමට" ලංකාවට හැකිවූයේය. එහෙත් විදේශිය සංචිත පිරිහියාමත් සමගම ලංකාවේ ආනයන ශක්තිය ප්‍රමාණවත් නොවීමේ මූලික ප්‍රශ්නය මතුව පෙනෙන්නට විය. මෙකී විදේශීය සංචිත, නොමැති විට ලංකාවට ගලා එන විදේශිය ප්‍රාග්ධන හා ආධාර ඇත. එහෙත්, අපනයන ඉපැයුම් මට්ටම දක්වා ආනයන වියදම අඩු කරනවා විනා, කළ හැකි වෙනත් දෙයක් නොමැත එහෙත්, ආර්ථික සංවර්ධන ප්‍රවනතාවය වේගවත් කිරීම සඳහා අවශ්‍ය වැඩිවෙමින් පවත්නා ආනයන ප්‍රමාණය සැපැයීමත්, වැඩි වෙමින් පවත්නා ජනගහණය කා අවශ්‍යතා සපුරා ලීමත් සඳහා මෙකී මට්ටම ප්‍රමාණවත් නොවන බැව් පැහැදිලි සත්‍යයකි. ආනයන ආදේශයෙන් මෙම ප්‍රශ්නය එක්තරා ප්‍රමාණයකට විසඳගත හැකි වුවද, පසුව විස්තර කැරෙන පරිදි එසේ කිරීමට ඇති හැකියාවද සීමාසහිත බැව් පෙනී යයි.

ලංකාවේ දීගුකාලීන ආනයන ශක්තිය පිළිබඳ ගැටළුව කෙළින්ම දේශිය මූල්‍ය පිස්කල් ප්‍රාසාරණයට සම්බන්ධව නොමැති බැව් මෙහිලා සැලකිය යුතුය. ආනයන සඳහා ඉඩ ලැබෙන නිදහස් ප්‍රතිපත්තියක් පැවතුන එක්දහස් නවසිය පනස් ගණන් වල අවසාන භාගයේ දී ඇරඹුන මූල්‍ය-පිස්කල් ප්‍රාසාරණය හේතු කොට ගෙන විදේශිය සංචිත වල සාපේක්ෂිත පහළ වැටීම ඉක්මන් විය. මූල්‍ය ප්‍රාසාරණ වේගය තරමක් අඩුවූයේවී නම් මෙම සංචිත කෙමෙන් පහළවැටීමට ඉඩ තිබිනි. එසේ වූයේ නම් ලංකාවට සිය අපනයන ඉපැයීම් මට්ටම දක්වා ආනයන අඩුකිරිමට සිදුවන අවස්ථාව කල් තැබීමට ඉඩ ලැබෙනු ඇත. මෙම අතරතුරේ කාලය ලංකාවේ විදේශිය ගෙවුම් තත්ත්වය ශක්තිමත් කර ගැනීම සඳහා උපයෝගී කර නොගතහොත්, විදේශීය ලැබීම් ප්‍රමාණය ඉක්මවා යන ආනයන මට්ටමක් සඳහා විදේශීය සංචිතයෙන් මුදල් වැය කළ නොහැකි තත්ත්වයකට වැඩි කල් යන්නට මත්තෙන් මුහුණ පෑමට සිදු වනු ඇත. වෙනත් ආකාරයකින් කිවහොත්, වෙළෙඳ අනුපාතයෙහි පවත්නා අවාසිදායක හැඩ ගැස්ම දිගටම පැවතීම හේතු කොට ගෙන ආනයන ශක්තියේ වර්ධනය අඩුවීමේ තත්ත්වය තවදුරටත් පවතින්නේ නම්, ආනයන සැපයීම් දුලබතාවයක් නිසා මතුවන ගැටළුවට වැඩි කල් යන්නට මත්තෙන් මුහුණ දීමට ලංකාවට සිදුවනු ඇත.

සංවර්ධන වෙමින් පවත්නා රටවල වර්ධනය සීමා කිරීමේ සාධකයක් වශයෙන් 'බාහිර බාධක" පිළිබඳ ගැටළුව කෙරෙහි දූන් සැලකිල්ල වැඩිවෙමින් පවතී. සතුටුදායක ආර්ථික වර්ධන වේගයක් ඇතිකර ගැනීම උදෙසා හුදෙක් දේශීය ඉතිරි කිරීම් පමණක් යෙදවීම ප්‍රමාණවත් නොවන්නේය. සාර්ථක සංවර්ධනයත්, විශේෂයෙන්ම කාර්මික දියුණුවත් රඳ පවත්නේ වැඩි වැඩියෙන් අමුද්‍රව්‍ය යන්ත්‍රෝපකරණද රටේ වැඩිවන මුදල් ආදායමට සරිලන පරිදි පාරිභෝගික භාණ්ඩ ද ලබා ගැනීමට එරටට ඇති ඉඩකඩ අනුවය. සංවර්ධනය වෙමින් පවත්නා විශාල රටවල් වලට වුවද, පෙරකී අවශ්‍යතාවන් රට තුලින්ම සපයා ගැනීම සඳහා අවශ්‍ය පමණට විවිධ ස්වභාවික සම්පත් හෝ ආරම්භක නිෂ්පාදන ශක්තිය හෝ ඇත්තේ කලාතුරකිනි. ඇත්ත වශයෙන්ම කුඩා රටවල් එතරම්වත් භාග්‍ය සම්පන්න නොවන්නේය. යටත් පිරිසෙයින් සංවර්ධනයේ ආරම්භක අවදියේදීත්, කුඩා රටවලට නම් සංවර්ධනයේ සියළුම අවස්ථාවලදීත් පිටරටවලින් විවිධ වූ අවශ්‍යතාවන් රාශියක් ලබා ගැනීමට සිදුවීම නොවැළැක්විය

හැකි කරුණකි. යම්කිසි රටක බාහිර ලැබීම් - එහි ආනයන ශක්තිය - මෙකී ආනයන අවශ්‍යතා මිල දී ගැනීමට හැකිවන පරිදි, ප්‍රමාණවත් ලෙස වැඩි නොවුවහොත්, එයින් පොදු ආර්ථික වර්ධන වේගය කෙරෙහි පීඩාකාරී බලපෑමක් ඇතිවීම නොවලැක්විය හැකි දෙයකි. විශාල භෞතික ආයෝජන පරිමාවකට මුදල් යෙදවීමට ප්‍රමාණවත් තරම් දේශීය ඉතිරි කිරීම් වැඩිවූ පමණින්ම වර්ධනය සඳහා ශිල්පීමය වශයෙන් අවශ්‍ය ආනයන අවශ්‍යතා ලබා ගැනීමට නොමැති වුවත් සීඝ්‍ර ආර්ථික වර්ධනයකට උචිත අන්දමේ ආයෝජන ඇති වේයැයි ස්ථිර වශයෙන්ම කිව නොහැකිය.

හැම විටම, ලංකා අර්ථ ක්‍රමයෙහි ආනයන සඳහා විශේෂ වූ තැනක් හිමිවී ඇත. හුදෙක්ම මෙයට හේතු වූයේ ආනයන-අපනයන අර්ථ ක්‍රමයක් වශයෙන් එහි ඇති "විවෘතභාවයයි" 1964 දී දළ ජාතික නිෂ්පාදිතයෙහි ආනයන වල සියයට ගණන 29 කි. මෙම ප්‍රමාණයෙන් වුවද, ආනයනවල ඇති වැදගත්කම සම්පූර්ණයෙන් දක්වන්නේ නැත. දළ ජාතික නිෂ්පාදිතයෙන් සේවාවන් අතහැර බලන විට, 1964දී පාවිච්චිය සඳහා ගැනීමට තිබූ මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් සියයට 47 ක් ආනයන භාණ්ඩ විය. තවද, අලෙවි කළ හැකි මුළු ඉපැයුම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා දළ ජාතික නිෂ්පාදිතයෙන් යැපීම් නිමැයුම අත්හැර බැලුවහොත්, අලෙවි කළ හැකි මුළු ඉපැයුම් ප්‍රමාණයෙන් සියයට 53 ක් ම ආනයන බව පෙනී යයි. නිෂ්පාදන කාර්ය පවත්වාගෙන යාම හෝ වැඩි කිරීම හෝ අත්‍යාවශ්‍ය පාරිභෝගික අවශ්‍යතා සැපයීම සඳහා හෝ සියලුම ආනයන ද්‍රව්‍ය අත්‍යාවශ්‍ය යයි කිව නොහැකිය. එහෙත්, පසුගිය අවුරුදු දෙක තුනේ දී විදේශීය සංචිත පහළ මට්ටමකට වැටීමත් සමග සමහර භාණ්ඩ ගෙන්වීම සම්පූර්ණයෙන් තහනම් කිරීමටත් අනවශ්‍ය හා එතරම් අවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය දැඩි ලෙස සීමා කිරීමටත් ලංකාවට සිදු විය. අමු ද්‍රව්‍ය මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය ද සීමා කිරීමට සිදුවූ අතර, නිෂ්පාදනය හා සංවර්ධන කටයුතු කෙරෙහි අවාසිදායක බලපෑමක් ඇති නොවන ලෙස තව දුරටත් ආනයන සීමාකිරීමට ඇති ඉඩකඩ ඉතාමත් අල්පය. අනෙක් අතට, ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනය සඳහා අමු ද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාණ්ඩ වැඩියෙන් ගෙන්වීම අත්‍යාවශ්‍ය දෙයකි. එම සැපයීම් ලබා ගැනීමට ඇති ශක්තිය යම් අයුරකින් සීමා වුවහොත්, ලංකාව සංවර්ධනය සඳහා දරණ උත්සාහය අඩපන වනු ඇත. ලංකාවේ අර්ථ ක්‍රමයෙහි විවෘතභාවය නිසාම, සංවර්ධනයට ඇති "බාහිර බාධකය" විශේෂ ශක්තියක් බව ඔප්පුවේ.

මේ අනුව ලංකාවේ ආනයන ශක්තිය වැඩිකිරීම පිළිබඳ ගැටළුව 1964 දී ප්‍රමුඛස්ථානයට පැමිණි හදිසි ආර්ථික ප්‍රශ්න අතුරින් එකකි. එහෙයින් ප්‍රතිපත්ති, සම්පාදනය කිරීමේදී ලංකාවේ ආර්ථික ප්‍රශ්නයෙහි මෙම අංශය පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. සාමාන්‍යයෙන් මෙම ගැටළුව සම්බන්ධයෙන් යෙදිය හැකි පිළියම් තෙයාකාරයකි. එනම්, අපනයන ඉපැයුම් වැඩි කිරීම, ආනයන ආදේශනය හා වැඩියෙන් විදේශීය ප්‍රාග්ධනය ගලාඒමට සැලැස්වීමයි. මෙම එක් එක් පිළියම් ක්‍රම වලට අදාළ වූ ප්‍රශ්න පිළිබඳව කෙටි විග්‍රහයක් කිරීම ප්‍රයෝජනවත් වනු ඇත.

(අ) අපනයන ඉපැයුම්.

ලංකාවේ ආනයන ශක්තිය වැඩි කිරීම සඳහා ගතයුතු පළමුවැනි වුවද ප්‍රත්‍යක්ෂවූ ද ක්‍රියා මාර්ගය වනුයේ ලංකාවේ අපනයන ඉපැයීම් වැඩිකර ගැනුමය. අනෙකුත් ක්‍රියා මාර්ග වලින් කිනම් ආකාරයේ ප්‍රතිඵල ලැබුව ද ආනයන ශක්තිය වැඩිකරලීම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා මූලික වූද, දිගු කාලීන වූද පිළියම

වනුයේ අපනයන ඉපැයීම් වැඩි කිරීමය. සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය ආනයන අවශ්‍යතා මිල දී ගැනීමට තරම් ප්‍රමාණවත් වේගයකින් අපනයන ඉපැයීම් වැඩිකිරීමට යාමේදී ලංකාවට අවහිරකම් කිහිපයකට මුහුණ පෑමට සිදු වෙයි. මීට ඉහත දක්වා ඇති පරිදි, අපනයන පරිමාව වැඩි වෙද්දීත්, පසුගිය දසක එක හමාර තුළ දී අපනයන වල ක්‍රය ශක්තිය වැඩිවීමේ සාමාන්‍ය සියයට ගණන වර්ෂයකට සියයට 1·6 ක් විය. ලංකාවට සම්පූර්ණයෙන්ම සිය අපනයන වල ක්‍රය ශක්තිය වැඩි කර ගැනීමේ මාගීයෙන්ම වැඩිවෙමින් පවත්නා ආනයන අවශ්‍යතා සපයා ගැනීමට නම් අපනයන වල ක්‍රය ශක්තියේ වැඩිවීමේ වේගය පසුගිය කාලයේ දීට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය යුතුය. සංවර්ධනය වෙමින් පවත්නා අනෙකුත් බොහෝ රටවලට මෙන්ම ලංකාවටදදළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතික ඉලක්කය වන අවුරුද්දකට සියයට 6 ක වැඩිවීමක් ඇති කර ගැනීමට නම් ආනයන වර්ධන අනුපාතිකය(1) ඊටත් වැඩි වාර්ෂික වේගයකින් වැඩි කිරීම අවශ්‍ය වන බැව් පෙනී යයි. මෙයින් අදහස් කැරෙනුයේ, ආනයනය සඳහා මුදල් යෙදවිය හැකි එකම මාගීය අපනයන ඉපැයුම් ලෙස සලකන්නේ නම් දළ ජාතික නිෂ්පාදිතය වැඩිවීමේ වේගයට වැඩි වේගයකින් අපනයන වල ක්‍රය ශක්තිය වැඩි විය යුතු බවය. එහෙත්, වර්තමාන ලෝක තත්වය අනුව බලන කල, මූලික නිෂ්පාදිත අපනයන එතරම් වේගයකින් පුළුල් කිරීම පිළිබඳව බලාපොරොත්තු ඇති කර ගැනීමට අපහසුය.

මෙය ලංකාවට පමණක් නොව මූලික ද්‍රව්‍ය අපනයනය කරනු ලබන සෑම රටකටම පාහේ මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රධාන ප්‍රශ්න අතුරින් එකකි. කාර්මික රටවල ඇති වෙළෙඳ පොළවල්වල මූලික නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම මෑත වර්ෂ වලදී වැඩිවී ඇත්තේ ඉතාමත් සුළු වශයෙනි. ද්‍රව්‍ය පිළිවෙල කිරීම් හෝ අනෙකුත් ක්‍රම හෝ මගින් මූලික නිෂ්පාදිතවල මිල ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර වශයෙන් එකමුතු ප්‍රයත්නයක් නොදැරුවහොත් එකී අවාසිදායක හැඩගැස්ම අනාගතයේදී යථා තත්වයට පත්වේයැයි අපේක්ෂා කළ නොහැකිය. දැනට පවත්නා තත්වය අනුව, සමහර මූලික නිෂ්පාදිත සම්බන්ධයෙන් 1963 දී සහ 1964 දී ඇතිවූවාක් මෙන් ඉඳහිට හෝ චක්‍රාකාරව හෝ ද්‍රව්‍ය මිල ඉහළ යාමට ඉඩ ඇත. එනමුදු එකී මිල වැඩිවීම් වලින් ලංකාවේ අපනයන වලට වාසියක් සැලසුනේ නැත. එම මිල වැඩිවීම් කෙටි කාලීන හෝ වහා වෙනස්වල සුළු හෝ ස්වභාවයකින් යුක්තවන අතර අවාසිදායක දීර්ඝකාලීන හැඩගැස්ම ආපසු හැරෙන ලකුණු ඒවායින් පිළිබිඹු නොකැරේ. මූලික ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන රටවල් විසින් නිෂ්පාදනය වැඩි කිරීමේ මාර්ගයෙන් ඔවුන්ගේ අපනයන ඉපැයීම් වැඩිකර ගැනීමට හෝ එම තත්වයේම පවත්වාගන යාමට හෝ ප්‍රයත්න දැරීමෙන් සිදුවනුයේ මිල පහළ වැටීම තවත් උග්‍රවීම පමණකි. කලින් සඳහන් කළ පරිදි, පසුගිය දශක එකහමාර තුළදී, නිමැවුම වැඩි කිරීම සඳහා ලංකාව විසින් දරා ඇති ප්‍රයත්නය හේතුකොටගෙන අපනයන ඉපැයුම්වල සැසඳිය හැකි වැඩිවීමක් ඇති නොවීය. එපමණක්ද නොව කාර්මික ආනයනවල මිල වැඩිවීමේ හැඩගැස්ම අපනයනවල ක්‍රය ශක්තිය තව දුරටත් පිරිහෙන්නට පටන් ගති. එක්දහස් නවසිය පණස් ගණන් වලදී, විශේෂයෙන්ම පණස් ගණන්වල පසු භාගයේදී මූලික නිෂ්පාදිත හා කාර්මික නිපැයුම් අතර වූ වෙළෙඳ අනුපාතයේ හැඩගැස්ම කාර්මික නිපැයුම්වලට හිතකර වූ අතර එයට අනුරූපව කාර්මික රටවලට ලාභදායකද වූයේය.

මෙසේ සලකා බලන ලද කරුණු බොහොමයක්ම ලංකාවේ වෙළෙඳ අනුපාතය පිළිබඳ මතු බලාපොරොත්තුවලට අදාල වනු ඇත. ලංකාවේ අපනයන අර්ථක්‍රමය පදනම් වී ඇති නිශ්චිත නිෂ්පාදන සියල්ලක්ම, විදේශීය වෙළෙඳ පොළවල්වල

(1) එක්සත් ජාතීන්ගේ "1963 ලෝක ආර්ථික සමීක්ෂණය" (1) වැනි කොටස, "එක්සත් ජාතීන්ගේ සංවිධානය, නිව්යෝක්" බලන්න.

ඉල්ලුම සුළු වශයෙන් වැඩිවීම හෝ කෘතිම ආදේශකයන්ගේ තරගයක් මතුවීම ආදී බලවේගයනට මුහුණ පා ඇත. මේ අනුව පොල් නිෂ්පාදිත හා රබර් වලට කෘතිම ආදේශක හෝ අනෙකුත් විකල්ප නිෂ්පාදිත හෝ සමග තරග කිරීමට සිදුවී ඇත. තේ ආනයනය කරනු ලබන ධනවත් රටවල, විශේෂයෙන්ම එක්සත් රාජධානි-යෙහි, නිෂ්පාදිතය සඳහා වූ ඉල්ලුමෙහි පහත් ආදායම් නම්‍යතාවයත්, මැද පෙරදිග ප්‍රදේශයේ රටවල උද්ගත වී ඇති ගෙවුම් ප්‍රශ්න හේතුකොටගෙන මැද පෙරදිග වෙළෙඳ පොළවල්වල ආනයන සීමා කිරීමත්, ලෝක තේ වෙළෙඳම කෙරෙහි බලපාන කරුණු වෙයි. එපමණක් ද නොව අලුත් ප්‍රදේශවල තේ නිෂ්පාදනය වැඩිවීම නිසා තේ වෙළෙඳ පොළේ පොදු තත්වය තව දුරටත් පිරිහින.

ලංකාව සිය මූලික අපනයන නිෂ්පාදිත නගාසිටුවීම සඳහා දරන ප්‍රයත්නය තව දුරටත් දැඩි කළ යුතුව ඇත. එහෙත්, අපනයන භෝග නැවත වගාව හා පුනරුත්ථාපනය කිරීමේදී ඇතිවන කාල පරතරයත්, අවාසිදායක මිල හැඩගැස්මත් නිසා, ලංකාවට ඉතා ඉක්මනින්ම අවශ්‍යව ඇති ආනයන ලබාගැනීමට සෑහෙන තරම් විදේශීය මුදල් ලබාගැනීම, වැවිලි අංශයෙන් පමණක්ම බලාපොරොත්තු විය නොහැකි දෙයක් බැව් පෙනීයයි. උදාහරණයක් වශයෙන්, නිෂ්පාදන වියදම් අඩු කර ලීමේ පරමාර්ථයෙන් අධික ඵලදාවක් ගෙන දෙන රබර් වර්ග නැවත වගා කිරීමෙන් නිමැවුම වැඩිවිය හැකිය. එහෙත්, මුළු අපනයන ඉපැයුම් සෑහෙන තරමකින් වැඩිකර ගැනීමේ මාර්ගයකට වඩා පහළ වැටෙමින් පවත්නා ලෝක මිල ඉදිරියේ, තිබෙන තත්වය රැකගැනීම සඳහා වුවද එලෙස නිමැවුම් වැඩි කිරීම අත්‍යාවශ්‍ය වන්නේය. වෙනත් ආකාරයකින් කිවහොත්, නිපැයුම් වැඩිවීම හේතු කොට ගෙන මිල පහළ බැසීම නිසා එයින් සැලසෙන ලාභය භුක්ති විඳිනුයේ විදේශීය පාරිභෝගිකයන්ය. තේ පිළිබඳව ජාත්‍යන්තර ගිවිසුමක් නොමැති බැවින් මිල කෙරෙහි හානිකර බලපෑමක් ඇතිකරලමින්, ලෝක තේ නිෂ්පාදනය, ලෝක පරිභෝජනයට වඩා සීග්‍ර වේගයකින් වැඩිවීමට ඉඩ ඇත. අධික ඵලදායි තේ වර්ග වගාවත් අලුත් ප්‍රදේශවල හා රටවලට නිෂ්පාදනය පැතිර යාමත් සමගම, එවැනි ජාත්‍යන්තර ගිවිසුමක් ඉතා වැදගත්වනු ඇත. ලංකාවට සිය තේ නිමැවුව තව දුරටත් වැඩි කිරීමේ හැකියාවක් ඇත. පසුගිය දශකය තුළදී නිෂ්පාදනය වැඩි-වීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ වැඩියෙන් පොහොර යෙදීමය. මෙකී මාර්ගයෙන් තව දුරටත් නිමැවුම වැඩිකර ගැනීමේ හැකියාව සීමා සහිතද නැද්ද යන්න අවිනිශ්-චිතය. එසේ වුවද, දැනටමත් අරඹා ඇති අධික ඵලදායි තේ වර්ග නැවත වගා කිරීමේ වැඩ පිළිවෙළ හේතුකොටගෙන නිමැවුමෙහි සැලකියයුතු වැඩිවීමක් ඇති කිරීමට හැකිවන බව නිසැකය. කෙසේ වෙතත්, මෙම ප්‍රයත්නයෙන් ලංකාවේ අපනයන ඉපැයුම් කෙරෙහි වාසියක් ඇතිවන්නේ, මෙම ද්‍රව්‍ය පිළිබඳ ලෝක වෙළෙඳම ශක්තිමත් කිරීම හා තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රියා මාර්ගයක්ද ඒ සමගම ඇතිවුවොත් පමණි. ඉකුත් දශකය තුලදී මූලික නිෂ්පාදිත පිළිබඳ ලෝක වෙළෙඳමේ අවාසිදායක හැඩගැස්ම දිගටම පැවැත්ම හේතුකොට ගෙන ආර්ථික සංවර්ධනය කෙරෙහි ඇතිවන බලපෑමත් ඒ සඳහා නොපමාවම ජාත්‍යන්තර මට්ටමේ ප්‍රතිකාරක ක්‍රියාවක ඇති අවශ්‍යතාවයත් 1964 දී ජිනීවාහී පවත්වන ලද, වෙළෙඳම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ප්‍රධාන තේමාවන් අතුරින් එකක් විය. ලංකාවේ නිශ්චිත අපනයන නිෂ්පාදිත වන තේ, රබර් හා පොල් නිෂ්පාදිත පිළිබඳ ගැටළුවෙන් එම තේමාව මනාව පැහැදිලි කැරෙන අතර, මෙම ද්‍රව්‍ය පිළිබඳව ජාත්‍යන්තර විසඳීම් වලත්, වෙළෙඳ අනුපාත-යෙහි දිගුකාලීන පහළ වැටීමකින් පීඩා ලබමින් සිටින සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ජාත්‍යන්තරව වන්දි වශයෙන් මුදල් සැපයීමේ වැඩ පිළිවෙළකත් අවශ්‍යතාවයද පැහැදිලි වෙයි.

ඇත්ත වශයෙන්ම, ලංකාවේ අපනයන ඉපැයීම් දැනට අපනයනය කරනු ලබන තේ, රබර්, පොල් හා අනෙකුත් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත විකිණීමෙන් ලැබෙන ලැබීම් වලට සීමා කිරීම් අවශ්‍ය නැත. අනාගතයේදී ලංකාවට සිය කාර්මික නිෂ්පාදිත යන් පිටරට විකිණීමෙන් ලැබෙන ආදායම්ද අපනයන ඉපැයීම්වලට එකතු කරගත හැකිය. දේශීය වෙළෙඳ පොළෙහි ඇති සීමාවන් පිළිබඳව සලකා බලන කල, ලංකාවේ මහා පරිමාන කාර්මික කිරීමක් ඇති කිරීම සඳහා මෙන්ම විදේශීය ගෙවීම් ප්‍රශ්නය පිළිබඳ දීර්ඝකාලීන පිළියමක් වශයෙන්ද කාර්මික අංශයේ අපනයන ශක්තියක් ඇතිකර ගැනීම අවශ්‍ය වන්නේය. ආනයන පාලනය හේතුකොටගෙන ඇතිවූ උනන්දුව නිසා ඉතාමත් මෑත කාලපරිච්ඡේදය තුලදී ලංකාව දේශීය වෙළෙඳ පොළ සඳහා භාණ්ඩ නිපැයෙන අලුත් කාර්මික ව්‍යාපාර ගණනාවක් ආරම්භ කළේය. එහෙත්, ලංකාවට අවශ්‍ය මුළු ආනයන ප්‍රමාණය මිල දී ගැනීමට හැකිවන පරිදි, මූලික නිෂ්පාදිත අපනයනයෙන් ලැබෙන ඉපැයීම් සෑහෙන අන්දමින් වැඩි කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කාර්මික අපනයන ශක්තිය විශාල පරිමාවකට ගෙන ඒමට සෑහෙන කාලයක් ගතවීම ස්වාභාවිකය. තවද, මහා පරිමාණවශයෙන් කාර්මික අපනයනය; ප්‍රාදේශීය වෙළෙඳ පොලවල් දියුණු කර ගැනීමට උපකාර වන අන්දමේ ආසියාවේ ප්‍රාදේශීය සහයෝගතා වැඩ පිළිවෙළක් අනුව රඳා පැවතිය හැකිය. එපමණක් ද නොව මහා පරිමාණ කාර්මික ශක්තියක් ලංකාවේ ඇර-ඹීමේදී යන්ත්‍ර සූත්‍ර උපකරණ හා අමු ද්‍රව්‍ය ආනයනයද වැඩිවනු ඇත. ඒ හේතු කොටගෙන විදේශීය ගෙවීම් ගැටළුව සඳහා අතුරු විසඳුමක් ද අවශ්‍යවනු ඇත. එහෙත්, මහා පරිමාණ කාර්මික අපනයනය පිළිබඳ ඉලක්කය සාපේක්ෂික වශයෙන් දිගු කාලීන එකක් වුවද, එවැනි අපනයනයන් පෝෂණය කිරීම සඳහා කළ හැකි හැම දෙයක් ම නොපමාව ඇරඹිය යුතුය. අළුත් කර්මාන්ත පටන් ගැනීමේ දී ආරම්භක වශයෙන් ඒවා දේශීය වෙළෙඳ පොල පදනම් කර ගෙන පටන් ගත්තත්, පසු කාලයක දී අපනයන කිරීමට තරම් දියුණු කිරීමට ඇති ඉඩකඩ පිළිබඳවද අවධානය යොමු කළ යුතුය.

(ආ) ආනයන ආදේශනය.

දිගු කාලීන බලාපොරොත්තු කුමක් වුව ද, කෙටි කාලීන වශයෙන් සලකා බලන කල ලංකාවේ ආනයන ඉපැයීම් වැඩි කිරීමෙන් පමණක් ලංකාවේ විදේශීය ගෙවුම් පිළිබඳ අවහිරකම් විසැඳීම හා අත්‍යාවශ්‍ය ආනයන ගලාඒම වැඩි කිරීම එතරම් පහසු නොවන බව පෙනී යයි. එබැවින් එවැනි විසඳුමක්, සඳහා පිටිවහලක් ලැබෙන වෙනත් ක්‍රියා මාර්ගයන් ගැන ද සලකා බැලිය යුතුවෙයි. මෙම ක්‍රියා මාර්ගවලින් දෙවැන්න වනුයේ ආනයන ආදේශනයයි. ලංකාවට සිය විදේශීය සංචිත පිරිමසා ගත හැක්කේ, ලංකාව මෙතෙක් කලාක් මෙන් සුඛෝපභෝගී භාණ්ඩ හා අනවශ්‍ය භාණ්ඩ ආනයන කිරීම සීමා කිරීමෙන් පමණක් නොවේ. ආනයන වෙනුවට දේශීය නිෂ්පාදන ආදේශනය කිරීමේ මාර්ගයෙන් ද විදේශීය සංචිත පිරිමසා ගත හැකිය. ඉහත සඳහන් කළ පරිදි, ආනයන සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය කර්මාන්ත ගණනාවක් පටන් ගන්නා ලදී. ලංකාව වැනි රටක කාර්මික නිෂ්පාදන ක්ෂෙත්‍රයෙහි ආනයන ආදේශන ක්‍රියා මාර්ගයක මාර්ගයෙන් විදේශීය විනිමය ඉතිරි කර ගැනීමේ දී දැඩි සීමාවන් ඇති බව මෙහි දී මනාව වටහා ගත යුතු වෙයි. පළමුවෙන් ම, කාර්මික ශක්තියක් ඇති කර ලීමේ දී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පමණක් නොව අමු ද්‍රව්‍ය හා අනෙකුත් අන්තර් භාණ්ඩ ද ආනයනය කිරීමට සිදුවෙයි. දේශීය අමු ද්‍රව්‍ය භාවිතයට ගන්නා කර්මාන්ත වලට ප්‍රමුඛත්වය දිය යුතු අතර, දේශීය වශයෙන් ලබා ගත හැකි අමු ද්‍රව්‍ය ප්‍රමාණය සීමාසහිත වන ලංකාව වැනි රටක එවැනි පදනමක් මත මහා පරිමාණ කර්මාන්ත පවත්වාගෙන යාම දුෂ්කර වෙයි. විශේෂයෙන් ම මුල් අවධියේ දී මෙරට නිෂ්පාදනය කැරෙන නිෂ්පාදිත වලට අඩංගු ආනයන ද්‍රව්‍ය වැඩිවීමත්, ආනයන

ආදේශනය මගින් ඉතිරි කරගනු ලබන විදේශීය විනිමය ප්‍රමාණය ඉතා සුළුවීමත් පුදුමයට කරුණු නොවේ. කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වය දීම තීරණය කිරීමේ දී විදේශීය විනිමය ඉතිරිකර ගැනීමේ හැකියාව එක්තරා මිනුම් දණ්ඩක් ලෙස පිළිගත යුතු නමුදු කාර්මික සංවර්ධනයට මුළුමනින් ම බාධා පැමිණෙන තරම් දුරට එම අදහසෙහි එල්බගෙන සිටීම උචිත නොවන්නේය. තවද, දේශීය වෙළෙඳ පොල සඳහා භාණ්ඩ නිපැයෙන කර්මාන්තයක ආරම්භක අවධියේ දී ඉතිරි කර ගත හැකි විදේශීය විනිමය ඉතා සුළු වුවද, පසු කාලයක දී අපනයන මාර්ගයෙන් විදේශීය විනිමය උපයාගත හැකිවන්නේය. ආනයන ආදේශන මූලධර්මය කාර්මික කිරීමේ ඒකායන පදනම වශයෙන් ගතහොත් ලාභදායී නොවන හෝ අධික වියදම් සහිත කාර්මික ආකෘතියක් ඇතිවීමට ඉඩකඩ ඇත.

කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ආනයන ආදේශනය මගින් ලංකාවේ විදේශීය ගෙවුම් ප්‍රශ්නයේ පීඩනය සැහෙන පමණකින් ලිහිල් නොවුන ද, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආනයන ආදේශනයෙන් ඇතිවන ප්‍රතිඵල එයට වඩා වෙනස් වෙයි. ලංකාව මූලික ද්‍රව්‍ය අපනයන කරන රටක් වශයෙන් ප්‍රචලිතව ඇති නමුදු ඇගේ ආනයනවලින් විශාල අනුපාතිකයන් සමන්විත වනුයේ ද මූලික නිෂ්පාදිත වලින්මය. ලංකාවේ අර්ථ ක්‍රමය විකාශනය වී ඇති, විශේෂ රටාව අනුව රටට අවශ්‍ය ද්‍රව්‍යවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පිටරටින් ලබාගැනීමට සිදු වී ඇත. මෙසේ ආනයනය කරනු ලබන ද්‍රව්‍ය වලට රටට අවශ්‍ය සහල් ප්‍රමාණයෙන් අඩක් පමණද, මාලු, සීනි, කිරි හා කිරි නිෂ්පාදිත, අල, ලූනු, මිරිස් හා ඒ සමාන ශීර්ෂයන්ගේ වැඩි කොටසක්ද අඩංගු වන්නේය. මෙම භාණ්ඩ පිළිබඳව ආනයන ආදේශනයක් කළහොත් වඩාත් සාර්ථක ලෙස විදේශීය විනිමය ඉතිරිකර ගැනීමට හැකිවනු ඇත. 1964 දී ලංකාවට ආනයනය කරන ලද මුළු ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් කෝටි101·08 ක් වූ අතර, එය මුළු ආනයන වියදමින් සියයට 51·2 ක් පමණ විය. සහල් ආනයනවල වටිනාකම රුපියල් කෝටි 32·63 ක්ද, සීනි ආනයන රුපියල් කෝටි 18·50 ක් ද, මාළු ආනයන රුපියල් කෝටි 6·85 ක් ද, කිරි හා කිරි නිෂ්පාදිත ආනයන රුපියල් කෝටි 9·34 ක් ද වූයේ ය. මෙකී භාණ්ඩ වර්ග පිළිබඳව ආනයන ආදේශනය කිරීම සඳහා එකමුතු ප්‍රයත්නයක් දැරුවහොත් එයින් ලංකාවේ විදේශීය ගෙවීම් තත්වය ශක්තිමත් කිරීමට මහත් රුකුලක් වන බව නිසැකය. ආනයන ආදේශන පරමාර්ථයෙන් කෘෂිකාර්මික අංශයේ සීඝ්‍ර දියුණුවක් ඇති කිරීමට යත්න දැරීම, අවශ්‍යයෙන් ම, කාර්මික කිරීමේ ඉලක්කයට ද මනාව සම්බන්ධ වන්නේ ය. කෘෂිකාර්මික ආනයන ආදේශනය හේතු කොට ගෙන, කෘෂිකාර්මික ද්‍රව්‍ය ආනයනය සඳහා විනිමය සම්පත් ප්‍රයෝජනයට ගන්නවා වෙනුවට කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා අමු ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ඒ මුදල් වැය කළ හැකි වන්නේය. මෙය වූකලී සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය ආනයන ලබාගැනීම සඳහා ලංකාවට ඇති ඉතා වැදගත් මාර්ගයක් බව පැහැදිලිය.

සමහර භෝග වර්ග හැරෙන්නට, කෘෂිකර්මාන්තයෙහි ආනයන ආදේශනය, ඉතා කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී මුදුන්පත් කර ගත හැකි පරමාර්ථයක් නොවන්නේය. මෙසේ ආනයන ආදේශනය කිරීමේ දී ශිල්පීමය ප්‍රශ්න වලට මුහුණ පෑමටත් ඒවායින් මිදීමටත් සිදු වන්නේය. එපමණක් ද නොව කෘෂිකර්මාන්තයෙහි විපර්යාසයක් ඇතිකර එම අංශයේ සීඝ්‍ර ඉක්මන් දියුණුවක් ඇති කිරීම, කර්මාන්ත ව්‍යාප්තකර ඉක්මන් දියුණුවක් ලබාගැනීම තරම් පහසු නොවන්නේය. ඒ මක්නිසාද යතහොත්, කෘෂිකර්මාන්තයේ විපර්යාසයක් ඇති කිරීමේ ආර්ථික පමණක් නොව සමාජ විද්‍යාත්මක වූ ද, සංකීර්ණ ප්‍රශ්න රාශියක් මතුවන බැවිනි. වැව්ලි නොවන කෘෂිකාර්මික අංශයේ සංවිධානය හා නිෂ්පාදනය සම්ප්‍රදායානුකූල ක්‍රම අනුව හැඩ ගැසී ඇති බැවින් එය නූතන අධික ඵලදායී ක්‍රමයකට පරිවර්තනය

කිරීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයක් දැරිය යුතුවෙයි. "කෘෂිකාර්මික රටකට" කර්මාන්ත වලට වඩා කෘෂිකර්මාන්තයෙහි සීග්‍ර දියුණුවක් ඇති කිරීම වඩාත් පහසු වේයයි සතිම වැරදි හැඟීමකි. එපමණක් ද නොව දේශීය කෘෂිකර්මාන්තයෙහි ප්‍රබල සංවර්ධන වැඩ පිළිවෙලක් ඇති කිරීමේ දී වාරි මාර්ග ඉඩම් සංවර්ධනය යනාදිය සඳහා ආයෝජන පැහැදම් වලට අධික ආනයන ද්‍රව්‍ය ප්‍රමාණයක් ඇතුලත්වනු ඇත. එබැවින් එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට ලංකාවට ඇති හැකියාව රඳා පවත්නේ ඇගේ විදේශීය විනිමය සම්පත්වල ප්‍රමාණවත් භාවය උඩය.

## ඈ. විදේශීය ප්‍රාග්ධන.

ඉහත කැරුන සාකච්ඡා වලින් පැහැදිලි වූ පරිදි, ලංකාවේ ගෙවුම් ශේෂ තත්ත්වය සහ ලංකාවේ අනාගත ආනයන ශක්තිය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් කෘෂිකාර්මික අංශයේ ආනයන ආදේශනය හා අපනයන කාර්මික භාණ්ඩ ද ඇතුළුව වැය කිරීම සඳහා දරන දැඩි උත්සාහයකින් සහනයක් ලබාගත හැකිය. එහෙත්, මෙවා දිගුකාලීන විසඳීම් සඳහා ඇති මාර්ගවෙයි. අතුරු කාලය තුල, ලංකාවේ වෙලෙඳ අනුපාතය, බලාපොරොත්තු රහිතව දියුණු වුවහොත්, ඒ ඒ ගෙවීම් පිළිබඳ දැඩි ප්‍රශ්නයකට ලංකාවට මුහුණ පෑමට සිදුවෙයි. මේ ප්‍රශ්නය අනෙකුත්, මාර්ග වලින් නොවිසඳුවහොත්, දිගු කාලීන, බලාපොරොත්තු සඵල කර ගැනීම පමණක් නොව, දැනට කරගෙන යන ආර්ථික කටයුතු ද අඩාලවීමට ඉඩ තිබේ.

මේ අන්තර් කාලය තුල උද්ගත වන බාහිර ගෙවුම් පිළිබඳ ප්‍රශ්න වලින්, සහනයක් ලබා වන වහා සංවර්ධනය සඳහා වැඩ පිළිවෙළක් සකසා ගැනීම් වස් ලංකාව තෙවැනිව ගත හැකි ක්‍රියා මාර්ගය උපයෝගී කොට ගත යුත්තේ ඒ නිසාය. මේ ක්‍රියා මාර්ගය වනුයේ පිටරටින් වැඩි වැඩියෙන් ප්‍රාග්ධන ලබාගැනීමය. අවම ආනයන අවශ්‍යතා සහ, අපනයන ඉපැයීම් අතර, පරතරයක්, ඇතිවීම අද දියුණුවෙමින් පවත්නා හැම රටකටම පොදු වූවකි. මූලික නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම සෑහෙන ප්‍රමාණයකින් වැඩි විය නොහැකි නිසාත්, ආනයන ආදේශනය කල හැකි ප්‍රමාණය සීමා සහිත නිසාත්, වේගයෙන් සංවර්ධනය වන රටවල ගෙවීම් දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා විශාල ප්‍රාග්ධන ප්‍රමාණයන් පිටින් ලබාගැනීම අවශ්‍ය වන්නේය. සංවර්ධනය වෙමින් පවත්නා රටවලට, මෑත වර්ෂවලදී බටහිර කාර්මික රටවලින් හා සමාජවාදී රටවලින් ගලා එන ප්‍රාග්ධන ප්‍රමාණයේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. මේ ප්‍රාග්ධන වැඩි වශයෙන් ඇත්තේ පෞද්ගලික ප්‍රාග්ධන මෙන් නොව ද්විපාර්ශ්වීය හා බහු පාර්ශ්වීය, නියෝජ්‍යත්ව යටතේ රජයේ ණය ආදිය වශයෙනි. මේ ලැබීම්, අපනයන වර්ධනය අඩුවීම නිසා සහ වෙලෙඳ අනුපාතය, අවාසි දායකවීම නිසා ඇතිවන හිඟයන් පිරිමැසීමට, යොදා ඇත. එහෙත්, ඉපැයීම් අතර, හා ආනයන අවශ්‍යතා අතර, ඇති පරතරය නැති කොට වැඩි ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීමට මෙය සෑහෙන ප්‍රමාණයකින් වැඩිකර ගත යුතුය.

මෑත වර්ෂවලදී ලංකාව ද ප්‍රාග්ධන ආධාර ලැබූ රටකි. එහෙත් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් එකට ගත් කල ආසියානු රටවල් සමස්ථකයක් වශයෙන් ගත් කල, එසේ ම, ලංකාවේ අසල් වැසියන්, හා සමකරන විට, ලංකාවට ලැබී ඇති විදේශාධාර සාපෙක්ෂිතව, අල්පයයි කිව හැකිය. මේ අනුව 1960 දී සංවර්ධනය වෙමින් තිබෙන රටවල ආනයන වලින් සියයට 25 කට ප්‍රාග්ධනය ලැබුන අතර, ආසියානු රටවල ආනයන වලින් සියයට 22 ක් ලැබිණ. එහෙත් 1960-64 කාලය තුල ලංකාවේ ආනයන සඳහා ලැබුන සාමාන්‍ය ප්‍රමාණය සියයට 4.2 ක් විය.[1]

සංඛ්‍යා සටහන I - 2

**ලැබුන ප්‍රාග්ධන සහ වෙළෙඳ අනුපාතයේ වෙනස්වීම්.**

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | එකතුව 1960–64 |
|---|---|---|---|---|---|---|
| ලැබුණ ප්‍රාග්ධන ශුද්ධ | 19.5 | 114.7 | 92.0 | 135.5 | 85.2 | 446.9 |
| වෙළෙඳ අනුපාතය ලාභ හෝ අලාභ (1958 මිලට) | + 22.3 | —112.1 | —38.0 | —207.3 | —268.9 | —604.0 |

සංවර්ධනය වෙමින් පවත්නා අනෙකුත් බොහෝ රටවල මෙන්නොව, ලංකාවේ ජාතික ආදායමෙන්, වැඩි සියයට ගණනක් ආනයන සඳහා වෙන් වෙයි. එහෙත්, ලංකාවට එන ප්‍රාග්ධනය, ජාතික ධනය හෝ, මුළු ආයෝජන හෝ අනුව මැන්නද, සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ අනෙකුත් රටවල් හා එපරිද්දෙන්ම සැසඳුවද, ලැබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සතුටු දායක නොවේ. මෙයට අමතරව, ලංකාව, බොහෝ සෙයින්ම ආනයන වලටම, ගැතිව, සිටින නිසා අවම ආනයන අවශ්‍යතා සහ අපනයන ඉපැයීම් අතර, පරතරය මකාලීම සඳහා ප්‍රාග්ධන ගලා ඒමේ අවශ්‍යතාවය දෙගුණ වෙයි. මෑත වර්ෂවල ලංකාවට ප්‍රාග්ධන වශයෙන් යමක් ලැබුනේද වෙළෙඳ අනුපාතය අවාසි සහගතවීම නිසා ඊට වැඩි පාඩුවක් ලංකාවට සිදුවිය. ලංකාවට ඇදී ආ ප්‍රාග්ධනයෙන්, වෙළෙඳ අනුපාතයවෙනස්වීම නිසා, පාඩුවී ද ලාභවී ද යන්න 1958 මිල අනුව සකසා ඉහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**ආනයන සඳහා මුදල් යෙදවූ අයුරු 1951 - 1962**
**(මුළු භාණ්ඩ හා සේවා ආනයනය = 100)**

| | භාණ්ඩ හා සේවා අපනයනය | ලැබුන ප්‍රාග්ධන | | | ප්‍රාදේශීය වත්කම් අඩුවීම (1) | වැරදි හා අත් හැරීම් |
|---|---|---|---|---|---|---|
| | | පෞද්ගලික | රාජ්‍ය | එකතුව | | |
| ඉන්දියාව | | | | | | |
| 1951—56 | 89.6 | 3.0 | 3.9 | 6.9 | 5.3 | —1.8 |
| 1957—62 | 66.4 | 5.9 | 21.7 | 27.5 | 7.6 | —1.5 |
| පකිස්ථානය | | | | | | |
| 1951—56 | 88.4 | 0.2 | 12.0 | 12.2 | —0.1 | —0.5 |
| 1957—62 | 69.2 | 1.9 | 28.9 | 30.8 | 0.3 | —0.3 |
| ලංකාව | | | | | | |
| 1951—56 | 105.7 | —6.0 | 1.0 | — 4.9 | —1.3 | 0.6 |
| 1957—62 | 92.5 | —2.6 | 3.7 | 1.0 | 3.4 | 0.1 |

සංඛ්‍යා: ආ. ඈ. පෙ· ආ. කො. සමීක්ෂණය 1963 12 වැනි පිටුව

(1) රින ලකුණින් විදේශීය වත්කම් වැඩිවීමක් දක්වයි.

(1) 1951 සිට 1962 කාලය තුල ඉන්දියාවේ, පකිස්ථානයේ සහ ලංකාවේ ආනයන සඳහා මුදල් යෙද වූ අයුරු පහත එන සංඛ්‍යා සටහනින් දක්වේ.

වෙළෙඳ අනුපාතයෙන් ලාභ හෝ අලාභ මැනීමේදී, පාදූ වර්ෂය තෝරා ගැනීම අනුව එය වෙනස් වෙයි. ඉහත තෝරාගෙන ඇති පාදූ වර්ෂය අපනයන මිල වැඩිව ගිය හෝ ආනයන මිල අඩු වූ හෝ වර්ෂයක් නොවේ. 1950 හෝ 1955 පාදූ වර්ෂය වශයෙන් ගෙන, වෙළෙඳ අනුපාතයේ බලපෑම මැන්නහොත්, ලංකාවට ඇතිවූ පාඩුව ඉහත සඳහන් කොට ඇති සංඛ්‍යාවලට වඩා සෑහෙන ප්‍රමාණයකින් වැඩිවිය හැකිය.

ඉදිරි වර්ෂ කීපය තුළදී ප්‍රාග්ධන ගලාඒම පුළුල් කිරීම, ආරම්භක අවධියේදී ලංකාවේ ආනයන ශක්තිය වැඩිකර ගැනීම සඳහා උපයෝගි කරගත හැකි වැදගත් මාර්ගයක් වනවාට සැක නැත. එමගින් කෘෂිකාර්මික හා කර්මාන්ත සංවර්ධන වැඩ පිළිවෙලවල් ඉක්මන් කිරීමටත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ විදේශීය තත්ත්වය ශක්තිමත් කර ගැනීමට මෙන්ම විදේශීය ආධාර මත යැපීම අඩු කර ගැනීමටත්, ලංකාවට හැකි වන්නේය. ලංකාවට අවශ්‍ය වී ඇත්තේ හුදෙක් ‚‚යෝජනා ක්‍රම ආධාර'' නොවේ. ඉතා ඉක්මනින්ම දැඩි ලෙස අවශ්‍ය වී ඇත්තේ, පොදු ආර්ථික ක්‍රියාකාරිත්වයේ ප්‍රවන තාවය පවත්වාගෙනයාම හා වැඩි කර ගැනීම සඳහා, ප්‍රමාණවත් ලෙස අමු ද්‍රව්‍ය හා ප්‍රාග්ධන උපකරණ ගලා ඒමට ඉඩ සැලසීමය. ලංකාවේ විදේශීය විනිමය අවහිරකම් ඇතිවීමත් දැඩි ආනයන පාලනයක් ඇති කිරීම හේතු කොටගෙන අමු ද්‍රව්‍ය හා භාණ්ඩවල අමතර කොටස් හිඟයක් ඇති විය. එය හේතු කොට, විශේෂයෙන් අලුතෙන් පැන නැගුන කාර්මික අංශයේ පවත්නා ශක්තිය සම්පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට ගැනීම වැළැක්විනි. ලංකාවේ මැදි කාලීන හා දිගු කාලීන සංවර්ධන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට යෝජනා ක්‍රම ආධාර වලින් පිටිවහලක් ලැබෙන අතර, රටේ විදේශීය ගෙවුම් තත්වය පවත්වාගන යාමත් ශක්තිමත් කිරීමත් සඳහා අතිරේක වශයෙන් විදේශීය සම්පත් රැස්කර ගැනීම ද අවශ්‍ය වන්නේය. මේ පිළිබඳව සලකා බලන කල, ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින්, ද්‍රව්‍ය හා අමතර කොටස් මිලට ගැනීම සඳහා අවශ්‍ය විදේශීය විනිමය වලින් ඉන්දියාවට සපයන ලද ණය ආධාර පිළිබඳ සංකල්පයේ අලුත් පිටුවක් ආරම්භ කළ බව මෙහිලා සඳහන් කිරීම උචිත වන්නේය.

වැඩි වැඩියෙන් විදේශීය සම්පත් ගලා ඒමට ඉඩ සැලසිය යුතු නමුදු එසේ සම්පත් ලබාගැනීමේදී ඇතිකර ගන්නා කොන්දේසි වලින් නුවමනා බරක් පටවා නොගැනීමට වග බලා ගැනීම ද ඉතා වැදගත් වන්නේය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් බොහොමයකටම ඔවුන්ගේ අපනයන ඉපැයීම් වලින් විශාල කොටසක්, පොලී හා විදේශීය ණය සඳහා වූ ක්‍රම ක්ෂය ගාස්තු වෙනුවෙන් ගෙවීමට සිදුවී ඇති නමුත්, වාසනාවකට මෙන් ලංකාව එවැනි තත්වයකට පත් වී නොමැත. එහෙත් දරුණු විදේශීය විනිමය හිඟයක් පවතින කාලෙක ලංකාවට ද, නුවමනා පොලී බරක් පැටවෙන සුලු වූ සපයන්නන්ගේ ණය හා ඒ සමාන වර්ගවල විදේශීය ණය බෙහෙවින්ම ගැනීමට සිදුවිය හැකිය. වඩාත් පිළිගත හැකි අන්දමේ ආධාර ලබාගැනීමට නොමැති විටක එවැනි උපක්‍රම යොදා ගැනීම නොවැළැක් විය හැකි දෙයක් වුවද, එවැනි ක්‍රම හේතුකොටගෙන ඉදිරි වර්ෂ තුලදී රටේ විදේශීය ගෙවුම් තත්වය දියුණුවනවාට වඩා පිරිහීමට ඉඩ ඇත.

### (3) 1964 පිස්කල් හා මූල්‍ය වර්ධනය.

ලංකාවේ විදේශීය ලැබීම් වර්ධනයේ අනුපාතිකය ප්‍රමාණවත් වේගයකින් වැඩි නොවී තිබිය දී රජයේ අයවැයෙහි ඇතිවූ අධික හිඟයක් නිසා ඉකුත් වසර කිහිපය තුළ රට තුළ මූල්‍ය ප්‍රාසාරණයක් වූ බව, මහ බැංකුවේ පසුගිය වාර්ෂික වාර්තාවලින් පෙන්නුම් කර දෙන ලදී. මූල්‍ය ප්‍රාසාරණයෙහි ප්‍රතිවිපාක දෙවැදෑරුම් විය. සාමාන්‍යයෙන්, ආනයන නිදහස්ව මෙහි ඇදී ආ ප්‍රථම අවස්ථාවේ දී, මූල්‍ය ප්‍රාසාරණය නිසා

ඇතිවූ අමතර ඉල්ලුම, ආනයන භාණ්ඩ වැඩි වැඩියෙන් ගෙන්වා ගැනීමෙන් සපුරාගනු ලැබීය. මෙසේ ගෙන්වන ලද විශාල ආනයන පරිමාව, නිසා රටෙහි විදේශීය සංචිත ශීඝ්‍රයෙන් අඩු වී ගියේය. මේ කාලය තුල විදේශ සංචිත අඩුවූවා විනා දේශීය මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවීය. මූල්‍ය ප්‍රාසාරණයේ ඇතිවූ විපාක පිළිබඳ පැහැදිලි ලකුණු ඇති නොවීය. විදේශීය සංචිත වේගයෙන් අඩුවීමත් සමග මූල්‍ය ප්‍රාසාරණයේ දෙවැනි අවසථාවට එළඹිණි. සංචිත පහළ වැටීම වළක්වා කෙලින්ම ආනයන සීමා කිරීමට සිදුවිය. මේ හේතු කොට, ගෙන්වනු ලබන භාණ්ඩ ප්‍රමාණය අඩුවිය. ප්‍රථම කොට එතරම් අවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කෙරෙහි ඇති කැරුන සීමාවන් ඉතා දැඩිවිය. එහෙත් රටේ සංචිත කෙරෙහි දිගටම ඇතිවූ පීඩනයත් සමග ආනයන බලපත්‍ර ක්‍රමය කොමෙන් පුලුල් කෙළේ අවසානයේ දී සියලුම ආනයන වියදම්, විදේශීය අය වැය ලේඛනයක් අනුව, බෙදා නියම කිරීමට සිදුවිය. අත්‍යාවශ්‍ය ආහාර සෑහෙන පමණට ගෙන්වීම සඳහා හැකි හැම ප්‍රයත්නයක්ම දැරූ අතර, නිදසුනක් වශයෙන්, රජ-යෙන් ගෙන්වනු ලබන ආහාර, විදේශීය මිල ඉහළ යමින් තිබියදීත් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට තරම් ගෙන්වන ලදී. ගෙවුම් ශේෂ කෙරෙහි ඇතිවන පීඩනය දිගටම පවතිද්දී සීමා කිරීම්වල බලපෑම අමු ද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාණ්ඩ ඇතුළු ආනයන ශීර්ෂ රාශියක් කෙරෙහි ඇතිවීම නොවැළැක්විය හැකිය.

මූල්‍ය ප්‍රාසාරණය අඛණ්ඩව පවතිමින් තිබිය දී, ආනයන දැඩි ලෙස සීමාකිරීම නිසා දේශීය මිල මට්ටම කෙරෙහි ඇතිවූ පීඩනය වඩාත් වැඩිවිය. කලින් ගෙන්වූ බඩු තොග තුබූ නිසා මේ පීඩනය කලකට සමහන් විය. එහෙත්, බඩු තොග අඩුවීමත් සමග, බඩු මිල වැඩිවීම වඩාත් පැහැදිලිව පෙනෙන්නට විය. තොග හෝ සිල්ලර මිල දර්ශකයක්, වැනි මිලෙහි වෙනස්වීම මනින දර්ශකයක් නොමැති නිසා මිල මට්ටම කෙතෙක් දුරට වැඩිවූයේද යන්න මිනිය හැකි නොවේ. මිලෙහි වෙනස්වීම් දක්වන එකම දර්ශකය වන, කොළඹ පාරිභෝගික මිල දර්ශකය පසුගිය වසර දෙක තුන තුළ දී පැහැදිලි වශයෙන්ම ඉහළ නැග ඇත. 1961 දී 104·8 ක්වූ මෙය 1962 දී 106·3 දක්වාද 1963 දී 108·8 දක්වාද 1964 දී 112·2 දක්වාද ඉහළ ගියේය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය, මිල ආධාර ලබන හා පාලනය කරනු ලබන භාණ්ඩ සඳහා වැඩි බරතැබීමක් ඇති කම්කරු පවුලක වියදම, පදනම් කොට සකසා ඇති බැවින් එහි විෂයපථය සීමාවෙයි. කොළඹ පාරිභෝගික මිල දර්ශක-යට ඇතුලත් නොවන වැදගත් ශීර්ෂවල මිල තොරතුරු අනුව, භාණ්ඩ ගණනීපයක සාපෙක්ෂක මිල වැඩිවීම් දක්වෙයි. ලංකාවේ මිල වෙනස්වීමේ ප්‍රවනතාවය, ප්‍රාසාරණාත්මක බලපෑම් අධිකවූත්, දිගු කලක් පැවතියාවූත් අනෙක් රටවල පමණට පැමිණ නැති බව සත්‍යයකි. එහෙත් ඉකුත් වාර්ෂික වාර්තාවල සඳහන් කළ පරිදි, උද්ධමනාත්මක හැඩගැස්ම කල් ඇතිව මැඩලූයේ නොමැති නම් එය සමුච්චිතව, ප්‍රබල වේගයක්වීමට ඉඩ ඇත. නිදසුනක් වශයෙන්, උද්ධමනාත්මක බලපෑමක් ඇති අවදියක අධි ලාභ ඉපයීම සඳහා භාණ්ඩ සඟවා තැබීමට පෙළඹෙයි. මෙයින් භාණ්ඩ හිඟය තවත් උග්‍රවන අතර, බඩු මිල තවත් වැඩිවෙයි. තවද ජීවන වියදම වැඩිවීමත් සමග, පඩි වැඩි කිරීම සඳහා ඉල්ලුම වැඩිවිය හැකිය. එසේ කැරෙන පඩි වැඩි කිරීම, නිෂ්පාදනය වැඩි කිරීමත් සමග, එකට නොගියහොත් මිල වැඩිවීම තවත් උග්‍රවී පඩි වැඩි කිරීම එයින්ම පැරදීමට ඉඩ තිබේ. ලංකාවේ හැටියට, වැටුප් වැඩිවීම නිසා නිෂ්පාදන වියදම් වැඩිවුවහොත්, එය ගෙවුම් ශේෂ කෙරෙහි අවාසි බලපෑමක් ඇතිකරලීමට හැක්කේය. අපනයන අංශයේ වැඩිවන වියදම පිටරට පාරිභෝගිකයින් පිට පැටවිය නොහැකිය. එම නිසා ආන්තික නිෂ්පාදකයින්ගේ නිපැයුම් පරිමාව අඩුවෙයි.

මූල්‍ය ඉල්ලුම අධිකව පවත්නා සමයක, සැපයුම සීමා කිරීම නිසා මිල මට්ටම පොදුවේ, වැඩිවීමට අමතරව, පරිපාලනාත්මකව සීමා කිරීම නිසා සැපැයුමෙහි හා මිලෙහි කෙටි කාලීන හෝ වාරික උච්චාවචනයක් ඇතිවිය හැකිය. බලපත්‍ර දීම, භාණ්ඩ සඳහා ඇණවුම් කිරීම, හා භාණ්ඩ නැව් මගින් ගෙන ඒම සඳහා කාලය ගතවන නිසා ක්‍රමානුකූලව ආනයන ගලා ඒමට බාධාවිය හැකිය. එවැනි අවස්ථා-වක, භාණ්ඩ ලැබීමට ගතවන කාලය අනුව විටින්විට ඒ ඒ භාණ්ඩ දුලබවීමත් මිල අධිකවීමත් ඇතිවිය හැකිය. සැපයුමෙහි හා මිලෙහි ඇතිවන මේ වෙනස්වීම් නිසා අමු ද්‍රව්‍ය, අනෙකුත් අන්තර් භාණ්ඩ, අමතර කොටස් නොයෙකුත් වර්ගවල යන්ත්‍ර-සූත්‍ර හා උපකරණ ලබාගත නොහැකිවීම නිසා ආර්ථික කටයුතු කෙරෙහි බාධාකාරී බලපෑමක් ඇතිකරලිය හැක්කේය.

මෙරට නිෂ්පාදනය වැඩිවීම, නිසා ආනයන අඩුවීම තරමක් දුරට මකාලීමට, පිළිවන්වී ඇත. කාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන්, මෙය විශේෂයෙන් කිව හැකිය. මෑත වර්ෂවල ආනයන ආදේශක කර්මාන්තවල වර්ධනය උනන්දු කරලීය. එහෙත්, වැඩිවූ දේශීය නිෂ්පාදන උද්ධමනාත්මක බලපෑම් සීමා කිරීමෙහිලා උපකාර වී ඇත්තේ සීමාසහිත ප්‍රමාණයකටය. එසේ වූයේ ආනයන ආදේශ පරිමාව සීමාසහිත විමත් ආනයන සැපයුම් අඩුවීම හෝ මූල්‍ය ප්‍රසාරණයෙහි බලපෑම සහමුලින්ම මකාලීමට තරම් එය කෙසේවත්ම ප්‍රමාණවත් නොවීමත් නිසාය. 1963 දී හා 1964 දී ලංකාවේ මුදල් සැපයුම මූර්ත දේශීය නිෂ්පාදිතයට වඩා සැලකිය යුතු වේගයකින් වැඩිවිය.

මෙවැනි ප්‍රශ්න උදුවී ඇති සමයක, මුදල් හා මූල්‍ය ප්‍රතිපත්තියේ එක් අරමුණක් විය යුත්තේ, ඉහත සඳහන් කළ පරිදි, මුළු ඉල්ලුම් හා මුළු සැපයුම අතර කිට්ටු සම්බන්ධතාවක් ඇතිවන අයුරු මූල්‍ය ප්‍රාසාරණය සීමා කිරීමයි. මෑත වර්ෂවල මූල්‍ය ප්‍රාසාරණයක් ඇතිවීම සඳහා තුඩු දුන් හේතූන් අතර රජයේ අය වැය ලේඛනයේ ප්‍රාසාරණාත්මක හිඟය බැංකු ක්‍රමය මගින් පෞද්ගලික අංශයට, මවාදීම ප්‍රධාන වෙයි.

1964 වසර තුළ මූල්‍ය හා පිස්කල් ක්ෂෙත්‍රයන්හි, ඇතිවූ සැලකියයුතු වෙනස්වීම් මීළඟට වැටිසන් කොට දක්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් වැඩි විස්තරයක් මෙම වාර්තාවේ II වැනි කොටසේ දැක්වෙයි.

## (අ) රජයේ අය වැය ලේඛනය.

1963 සඳහාවූ වාර්ෂික වාර්තාවෙන්, 1960/61 සිට 1962/63 දක්වාවූ මුදල් වර්ෂ තුළදී රජයේ අය වැය ලේඛනයේ මුළු ප්‍රාසාරණාත්මක හිඟය විශාලවූ මුත් රුපියල් කෝටි 25·11 වූ මුදුන් මට්ටමට පැමිණි 1959/60 වසරට වඩා සාපේක්ෂක වශයෙන් සාමාන්‍යයෙන් පහළ වැටුණු බව පෙන්වා දෙන ලදී. 1962/63 දී මුළු ප්‍රාසාරණාත්-මක හිඟය රු.පි. කෝටි 16·20 දක්වා අඩුවිය. 1963/64 මුදල් වර්ෂයේ අය වැය ලේඛනයේ ප්‍රාසාරණාත්මක හිඟය තවත් අඩුවෙතැයි අපේක්ෂා කැරිණි. මෙහි, ප්‍රාසාරණාත්මක මාර්ගවලින් පියවීමට බලා පොරොත්තු වූයේ ඇත්ත වශයෙන්ම රුපියල් කෝටි 5·45 ක් පමණෙකි. එහෙත් අන්තිමේදී මෙකී බලාපොරොත්තු සඵල වූයේ නොවේ. 1963/64 බදු වර්ෂයේ නියම ප්‍රසාරණාත්මක හිඟය රුපියල් කෝටි 16·29 ක් විය. එබැවින් එය ඉකුත් වසරේදී ඇතිවූ පමණට අඩුවූයේ නම් සුළු වශයෙනි.

මෙසේ වීමට හේතු වූයේ මුල් ඇස්තමේන්තු අනුව, ආදායම සහ විදේශාධාර අඩුවීමය. 1963/64 නියම වශයෙන් ලැබුන ආදායම, රුපියල් කෝටි 175·35 ක්වූ අතර, ඇස්තමේන්තු කළ ප්‍රමාණය රුපියල් කෝටි 178·76 ක් විය. මෙය රුපියල් කෝටි 3·41 කින් අඩුවීමකි. විදේශාධාර රුපියල් කෝටි 17·5 ක් ලැබෙනැයි ඇස්තමේන්තු කළද, ලැබුනේ රුපියල් කෝටි 9·86 ක් පමණකි. කෙසේ වුවද, 1963/64 සඳහා ඇස්තමේන්තු කළ ප්‍රාසාරණාමක හිඟයත්, ඇති වූ නියම හිඟයත් අතර වෙනසට ප්‍රධාන හේතුව වූයේ, ආහාර වියදමෙහි වැඩිවීමත් සමග ජංගම වියදමෙහි ඇතිවූ වැඩිවීමය. 1963/64 මුළු ජංගම වියදම, අයවැය ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 9·77 කින් වැඩිවිය. එහෙත් ආහාර ආධාර වියදම පමණක් රුපියල් කෝටි 10·25 කින් වැඩිවිය. ආහාර ආධාර වියදම ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩිවීමට ප්‍රධාන සාධකය වූයේ ඇස්තමේන්තු මිලට වඩා ලෝක වෙළෙඳ පොළේ සීනි මිල සීග්‍රලෙස ඉහළ යාමය. සීනි ගෙන්වා බෙදා හරිනු ලබන්නේ රජය විසිනි. මින් ලැබෙන ලාභය සහනාධාර මිලට සහල් විකිණීමෙන් සිදුවන පාඩුව තරමක් දුරට මකාලයි. රට තුල සීනි විකුණන මිල නොවෙනස්ව තිබිය දී පිටරටින් ගන්නා මිල වැඩිවීම නිසා 1963/64 සීනි වලින් ලැබුණ ලාභය මුලින් බලාපොරොත්තු වූවාට වඩා අඩුවිය. එබැවින් ඇස්තමේන්තු වලට පදනම්වූ මිලට වැඩියෙන්, ලෝක වෙළෙඳ මිල වැඩිවීම අයවැය බලාපොරොත්තු හා ඉන් ලැබුන ප්‍රතිපල අතර ඇති වෙනසට, තුඩුදුන් ප්‍රධාන සාධකයන් ලෙස දැක්විය හැකිය. එහෙත්, මුල් ඇස්තමේන්තු වලට වඩා රජයේ ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 13·61 කින් සැලකිය යුතු ලෙස අඩුවී ඇත.

ඉහත විග්‍රහයට අනුව, 1963/64 ආහාර ආධාර වියදම සීග්‍රයෙන් වැඩි නොවිණි නම්, ප්‍රාසාරණාත්මක හිඟයේ ප්‍රමාණය සම්බන්ධයෙන් රජයේ අයවැය ගනුදෙනු වල කලින් වසරේදීට වඩා සැහෙන දියුණුවක් ඇති විය හැකිව තිබිණි. 1963/64 වසරේ සැලකිය යුතු ලක්ෂණයක් වූයේ රජයේ ආදායම සැලකිය යුතු අන්දමින් වැඩිවීමය. මුළු ආදායම්, 1962/63 රුපියල් කෝටි 159·34 සිට 1963/64 රුපියල් කෝටි 175·35 දක්වා රුපියල් කෝටි 16·01 කින් වැඩිවිය. මෙය, ඇත්ත වශයෙන්ම තනි, වර්ෂයක් සඳහා සැලකිය යුතු වැඩිවීමකි. ආනයන බදු, රුපියල් කෝටි 8·38 කින් වැඩිවීම ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුව විය. රෙදිපිළි, ධාන්‍ය හා පිටි ආනයනවල සහ රජයේ ආදායම් විග්‍රහයේ "අනෙකුත් භාණ්ඩ" ගණය යටතේ භාණ්ඩ වලින් එකතු කළ බදු වැඩිවිය. අධිභාරය ඇතුළු ආදායම් බද්දෙන් ලැබුන ආදායම රුපියල් කෝටි 2·60 කින් වැඩිවූ අතර, සාමාන්‍ය අලෙවි හා පිරිවැටුම් බදු වලින් ලද ආදායම රුපියල් කෝටි 1·59 කින් වැඩිවිය. මෙම වැඩිවීම්, රබර් අපනයන බද්ද, භූමිතෙල්, මෝටර් ස්ප්‍රිතු හා ද්‍රව ඉන්ධන ආනයන සහ දුම්කොළ, හා සිගරැට් බදු ආදායම් ද කලින් ඉවත් කර ගනු ලැබූ ඉඩම් බද්ද හා ජාතික සංවර්ධන බද්ද වැනි බදු වලින් ලැබීම් ද අඩුවීමෙන් සුළු වශයෙන් මැකී ගියේය.

1962/63 රුපියල් කෝටි 153·4 ක්වූ ජංගම වියදම් 1963/64 දී රුපියල් කෝටි 175·84 දක්වා රුපියල් කෝටි 22·44 කින් වැඩිවිය. පසුගිය වර්ෂයට අදාලව ආහාර ආධාර වියදමෙහි වැඩිවීම රුපියල් කෝටි 18·94 ක් විය. ඉහත සඳහන් කළ පරිදි ආහාර ආධාර වියදමෙහි මෙකී වැඩිවීමට තුඩුදුන් ප්‍රධාන සාධකය වූයේ ලෝක වෙළඳ පොළෙහි සීනි මිල වැඩි වීමය.

1962/63 රුපියල් කෝටි 153·4 ක්වූ ජංගම වියදම් 1963/64 දී රුපියල් කෝටි 175·84 දක්වා රුපියල් කෝටි 22·44 කින් වැඩිවිය. පසුගිය වර්ෂයට අදාලව ආහාර ආධාර වියදමෙහි වැඩිවීම රුපියල් කෝටි 13·94 ක් විය. ඉහත සඳහන් කළ පරිදි ආහාර ආධාර වියදමෙහි මෙකී වැඩිවීමට තුඩුදුන් ප්‍රධාන සාධකය වූයේ ලෝක වෙළෙඳ පොලේ සීනි මිල වැඩිවීමය. ඉකුත් වර්ෂයට අදාලව, සීනි වලින් ලැබුන ලාභය රුපියල් කෝටි 7·95 කින් පහළ වැටී ඇත. විශේෂයෙන්ම සුදු සීනි ගොඩබෑන මිල දෙගුණයක් පමණ වූයේ 1962/63 දී රුපියල් 637 ක්වූ දිගු ටොන් එකක් 1963/64 දී රුපියල් 1135/– ක් විය. පිටි විකිණීමෙන් ලැබුන ලාභයද අඩුවිය. මෙම ලාභ 1962/63 දී රුපියල් කෝටි 2·70 සිට රුපියල් කෝටි 2·6 කින් පහළ වැටුනේ 1963/ 4 දී ලද ලාභය රුපියල් කෝටි 0·1 ක් පමණක් විය. මෙය පිටි මිල රාත්තලකට ශත 5 ක් අඩු කිරීමේත්, ආනයන මිල වැඩිවීමේත් ප්‍රතිඵලයයි. ජංගම වියදමෙහි අනෙකුත් ශීර්ෂයන්ගේ ද ප්‍රමාණවත් වැඩිවීම් දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් 1963/64 දී අධ්‍යයන වියදම් රුපියල් කෝටි 2·34 කින් වැඩිවූ අතර, විශ්‍රාම වැටුප් හා රාජ්‍ය ණය පොළී වියදම් රුපියල් කෝටි 2·96 කින් වැඩි විය. කලින් සඳහන් කළ පරිදි, 1963/64 වසර තුළ ප්‍රාග්ධන වැය සම්මතයන්හි සැලකිය යුතු ප්‍රමාණයක ඌන වියදමක් ඇති වුවද, 1962/63 දී රුපියල් කෝටි 48·9 ක්වූ ප්‍රාග්ධන වියදම 1963/64 දී රුපියල් කෝටි 50·33 ක් විය. කලින් වර්ෂයට අදාලව මෙම වියදම් රුපියල් කෝටි 1·43 කින් වැඩි වී ඇත්තේ රජයේ නියෝජ්‍යත් වයනට දෙන ලද ලෝන රුපියල් කෝටි 2·66 කින් වැඩිවීමත් මූල්‍ය වත්කම් අත්කර ගැනීමත් නිසාය. ඉඩ් කිරීම් අත්කර ගැනීම් හා ස්ථාවර වත්කම් පවත්වා ගෙනයාම සඳහාවූ ප්‍රාග්ධන වියදම් 1962/63 වසරේ රුපියල් කෝටි 47·91 සිට 1963/64 දී රුපියල් කෝටි 46·68 දක්වා රුපියල් කෝටි 1·23 කින් පහළ වැටිණි.

1963/64 මුදල් වර්ෂය සඳහා රජයේ අය – වැය හිඟය රුපියල් කෝටි 51·92 ක් විය. නිදන් අරමුදල් දායක දීමනා සඳහා ගැලපූ විට ශුද්ධ අය වැය හිඟය රුපියල් කෝටි 46·24 ක් විය. 1962/63 ඇතිවූ ශුඬ අය වැය හිඟය රුපියල් කෝටි 39·17 කි. 1963/64 වසරේ හා ඊට පෙර වර්ෂවල ඇතිවූ අය–වැය හිඟයන් පියැවුන අයුරු පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇතः–

සංඛ්‍යා සටහන 1 – 3

**හිඟය පියවීම, 1959/60 සිට 1963/64 දක්වා**

රුපියල් දශ ලක්ෂ

| | 1959/60 | 1960/61 | 1961/62 | 1962/63 | 1963/64 |
|---|---|---|---|---|---|
| 1. බැංකු නොවන මාර්ගයන්ගෙන් හිඟය පියවීම (එකතුව) .. .. .. | 170·5 | 212·2 | 269·7 | 213·2 | 301·8 |
| මෙයින් (අ ) පරිපාලන ණය .. .. .. | 57·4 | 29·4 | 104·5 | — 33.8 | — 1·1 |
| (ආ) බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් ගත් ණය .. .. .. | 86·5 | 165·2 | 109·4 | 153·5 | 206·1 |
| (ඇ) විදේශීය ණය හා දීමනා .. .. | 26·6 | 26·6 | 55·8 | 93·5 | 96·8 |
| 2. දේශීය බැංකු ක්‍රමයෙන් ගත් ණය .. .. | 241·1 | 241·4 | 226·6 | 178·1 | 115·2 |
| 3. යොදගත් රජයේ මුදල් ශේෂ .. .. | 6·0 | නැත | — 40·2 | 0.4 | 45·4 |
| 4. මුළු මුදල් හිඟය (ශුද්ධ) .. .. | 417·5 | 462·5 | 456·1 | 391·7 | 462·4 |
| 5. එ ජ. ආධාර, ප්‍රතිපාර්ශ්වීය ගිණුමේ වෙනස ගැලපීම .. .. .. .. | 4·0 | — 7·5 | 4·0 | — 16·5 | 2·3 |
| 6. අය–වැය ලේඛනයේ ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම (2 + 3 + 5) .. .. .. | 251·1 | 233·9 | 190.4 | 162·0 | 162·9 |

ඉහත සංඛ්‍යා සටහනින් දක්වා ඇති පරිදි 1963/64 හිඟය පියවීමේ මාර්ගවල ප්‍රධාන ලක්ෂණ වලින් එකක් වූයේ බැංකු නොවන මාර්ග වලින් ගත් දේශීය ණය 1962/63 දී රුපියල් කෝටි 15·35 ක්වූ අතර, 1963/64 රුපියල් කෝටි 20·61 ක් දක්වා වැඩිවීමය. මෙයට බොහෝ දුරටම ඉවහල් වූයේ ඉතිරි කිරීම් ආයතන හා ප්‍රධාන වශයෙන් රක්ෂණ සංස්ථාව ඇතුළු රක්ෂණ අරමුදල් හා වෙළෙඳ සමාගම් හා අනෙකුත් රජයේ සමායතන විසින් ණය වශයෙන් රජයට දෙන ලද දායක දීමනා වැඩිවීමය. තනි වශයෙන් මෙසේ වැඩිම ණය දී ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලයි. රජයේ සුරැකුම් සඳහා ඉන් ලද දායක මුදල 1962/63 රුපියල් කෝටි 6·17 සිට 1963/64 වන විට රුපියල් කෝටි 6·56 දක්වා ඉහළ ගියේය. සැලකිය යුතු ප්‍රමාණයක් බදු සංචිත සහතික සඳහා ද යොදවා ඇත. 1962/63 දී ප්‍රයෝජනයට ගනු ලැබූ විදේශාධාර වැඩි වුවද, එහි සැලකිය යුතු වැඩිවීමක් 1963/64 දී ඇති නොවීය. කලින් දක්වූ පරිදි උපයෝගී කොටගත් විදේශාධාර ප්‍රමාණය, මුල් ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 17·5 ට වඩා සැහෙන ප්‍රමාණයකින් අඩු විය.

ප්‍රසාරණාත්මක මාර්ග වලින් එනම්, ප්‍රධාන වශයෙන්ම, බැංකු ක්‍රමයෙන් ණය ගැනීමෙන් හා මුදල් ශේෂ අඩු කිරීමෙන්, පියැවුන ප්‍රමාණය රුපියල් කෝටි 16·29 ක් විය. 1963/64 වසර තුළ මුදල් ශේෂ උපයෝගී කරගැනීම වැඩිවූ අතර, බැංකු ක්‍රමයෙන් ගත් ණය කලින් වර්ෂයේදී රුපියල් කෝටි 17·81 ක්වූ මුත් එය රුපියල් කෝටි 11·52 දක්වා අඩුවිය. බැංකු ක්‍රමයෙන් ණය ගනු ලබන ප්‍රධාන උපකරණය වූයේ භාණ්ඩාගාර බිල්පතයි. නිකුත් කොට නොබේරා තබාගත හැකි භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය මුදල් වර්ෂය තුළ දෙවරක් පාර්ලිමේන්තුව විසින් වැඩි කරන ලදී. 1963 මුදල් පනත යටතේ රුපියල් කෝටි 10·0 කින් ද, 1964 8–28 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් රුපියල් කෝටි 25·0 කින් ද වැඩි කරන ලදී. 1963/64 මුදල් වර්ෂය අවසානයේ දී භාණ්ඩාගාර බිල් සඳහා බලය ලත් සීමාව රුපියල් කෝටි 150·0 ක් වූ අතර, බේරීමට ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල් ප්‍රමාණය රුපියල් කෝටි 125·0 ක් ද විය. භාණ්ඩාගාර බිල් සඳහා නැවතත් ප්‍රධාන දායකයා වූයේ මහ බැංකුවයි. 1963/64 අවසානයේදී මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල් ප්‍රමාණය නොබේරූ මුළු භාණ්ඩාගාර බිල් වලින් සියයට 92·2 ක් හෙවත් රුපියල් කෝටි 115·32 ක් විය. වෙළෙඳ බැංකු සිය භාණ්ඩාගාර බිල්පත් අයිතිය අඩු කොට රජයේ වෙනත් සුරැකුම්පත්වල ආයෝජන වැඩි කළේය. එහෙත් වෙළෙඳ බැංකු වලින් රජය ගත් ණය ප්‍රමාණය වසර තුළ අඩු විය.

1964/65 බදු වර්ෂයේ අය වැය ලේඛනයට 1964 අවසන් කාර්තුව ද ඇතුළත් වෙයි. 1964/65 වසර සඳහාවූ ඇස්තමේන්තුවල විස්තර මෙම වාර්තාවෙහි II වැනි කොටසින් දක්වා ඇත. අය වැය ලේඛනයෙහි රුපියල් කෝටි 50·9 ක මුළු හිඟයක් බලාපොරොත්තුවූ අතර, ඉන් රුපියල් කෝටි 25.0 ක් බැංකු නොවන දේශීය වෙළෙඳ පොලෙන් ගනු ලබන ණය වලින් ද, රුපියල් කෝටි 22·5 ක් විදේශාධාර වලින් ද, රුපියල් කෝටි 3·5 ක් පරිපාලන ණය මාර්ගයෙන් ද ගෙන පියවීමට අපේක්ෂා කැරිණි. උද්ධමනාත්මක මාර්ගයන්ගෙන් හිඟය පියවා ගැනීම සැලකිල්ලෙන් මගහැර තිබීම අය-වැය ලේඛනයේ සැලකිය යුතු ලක්ෂණයක් විය.

1964/65 ජංගම වියදම් සඳහා මුළු ප්‍රතිපාදිතය–ආවර්තන වැය සම්මත යටතේවූ ප්‍රාග්ධන ශීර්ෂ, නිදන් අරමුදල් දායක දීමනා හා ණය ආපසු ගෙවීම් (අවක්‍ර) හැර රුපියල් කෝටි 174·51 ක් වූයේය. 1963/64 වසර සඳහා නියම වියදම රුපියල් කෝටි 175·84 ක් විය. මෙසේ වියදම අඩුවීමට ලෝක වෙළෙඳ පොළේ සීනි මිල අඩුවීමෙන් ආහාර ආධාර සඳහා ප්‍රතිපාදනය අඩුවීමත්, මහ බැංකුව මිලට ගත් භාණ්ඩාගාර බිල් සඳහා පොළී අනුපාතිකය පහළ හෙළීමත්, හේතු විය. 1964/65 මුළු

ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව රුපියල් කෝටි 64·76 ක් විය. මෙය 1963/64 ලැබුන ප්‍රාග්ධන වියදමට වඩා රුපියල් කෝටි 14·43 කින් වැඩිය. 1964/65 මුළු ආදායම් ඇස්තමේන්තුව, කලින් වර්ෂයේ ලැබුන ආදායමට වඩා රුපියල් කෝටි 12·79 කින් වැඩිවූයේ රුපියල් කෝටි 188·14 ක් වූයේය. බලාපොරොත්තු වන මෙම වැඩිවීමෙන් රුපියල් කෝටි 10·66 ක් නව ආදායම් යෝජනා වලින් ලැබෙතැයි අපේක්ෂිතය. මෙහි විස්තර මෙම වාර්තාවේ පසුව දක්වනු ලැබේ.

1964 දෙසැම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නිසා යෝජිත ආදායම් විධිවිධාන සමහරක් පනවා ගත නොහැකි විය. එහෙත්, භාණ්ඩාගාරයේ තාවකාලික ඇස්තමේන්තු අනුව, අනෙකුත් ශීර්ෂ යටතේ අයවැය ඇස්තමේන්තු වලින් බලාපොරොත්තු වූ ප්‍රමාණයනට වැඩියෙන් ආදායමක් ලැබීමෙන් මේ හේතුවෙන් අඩුවන ආදායම පමණටත් වැඩියෙන් මැකී යනු ඇතැයි අපේක්ෂා කැරේ. මේ වැඩි ආදායම ආනයන බදු වලින්, ආදායම් බද්දෙන් දේශීය භාණ්ඩ බද්දෙන් සහ රජයේ සමායතන වලින් ලැබේ. එසේම, රජයේ සුළිසුළං ආධාර, හා අනෙකුත් පුනරුත්ථාපන වියදම් නිසා රජයේ පරිපූරික වියදම වැඩි විය හැකි වුවද, 1964 අවසාන කොටසේදී හා 1965 මුල් හරියේදී ඇතැම් ප්‍රදේශ වලට බලපෑ නියඟය හේතුකොටගෙන සහතික මිල ක්‍රමය යටතේ ගනු ලබන වී ප්‍රමාණය, අඩු වෙතැයි බලාපොරොත්තු වන නිසා වෙන් කොට ඇති ප්‍රමාණයට වඩා රජයේ මුළු වියදම අඩුවෙතැයි බලාපොරොත්තු වනු ලැබේ. ආදායම් හා ජංගම වියදම් පිළිබඳ භාණ්ඩාගාරයේ බලාපොරොත්තු සඵල වුවහොත්, මුළු අයවැය හිඟය බලාපොරොත්තු ප්‍රමාණයට වඩා අඩුවිය හැකිය. එහෙත් ආහාර ආධාර වියදම සම්බන්ධයෙන්, මිලට ගනු ලබන වී ප්‍රමාණය අඩුවීම නිසා අයවැය ලේඛන වියද-මෙහි ඉතිරියක් ඇති වුවද, සහල් නිපැයුම අඩුවීම නිසා අඩු වූ ප්‍රමාණය, පිටරටින් ගෙන්වීමට සිදුවන බැවින් ඊට අනුරූපව ලංකාවේ ගෙවුම් ශේෂ කෙරෙහි පීඩනයක් ඇතිවිය හැකිය.

මෑත වර්ෂවල ලංකාවේ අයවැය අත්දැකීම් විග්‍රහ කරන විට, වැදගත් සාධක තුනක් මතුව දිස්වෙයි. ප්‍රථමයෙන්ම ලංකාව, බදු මගින් හා බැංකු නොවන මාර්ග වලින් ණය ගැනීමෙන් රජයේ ජංගම හා ප්‍රාග්ධන වියදම් පියැවීම සඳහා අතිරේක ධන මාර්ග යොද ගැනීමට දැඩි ප්‍රයත්නයක් දරා ඇත: රජයේ ආදායම, විශේෂ යෙන් සැලකිය යුතු පරිදි වැඩි වී ඇත. 1964 දී රජයේ මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24·6 ක් විය. මෙය සංවර්ධනය වෙමින් පවත්නා රටක කලාතුරකින් ඇතිවිය හැකි අනුපාතයකි. බදු මගින් ආදායම වැඩි කර ගැනීමට ලංකාව දැඩි ප්‍රයත්නයක් දරා ඇති අතර, සමහර ක්ෂෙත්‍ර වල බදු අනුපාතිකය ඉතා වැඩි වී ඇත. කෙසේ වුවද රජයේ වියදම් අවශ්‍යතා වැඩිවෙත්ම ප්‍රාසාරණාත්--මකව පියවන ප්‍රමාණය සීමා කිරීමට සිදුවන බැවින් මෙසේ කිරීම අවශ්‍ය වී ඇත.

දෙවැනිව, රජයට ඇති ධන මාර්ග වලින් විශාල ප්‍රමාණයක් තවදුරටත්, ආහාර පිහිටාධාර සඳහා වැය කිරීමට සිදුව ඇත. උද්ධමනාත්මක පීඩනයන් සීමා කළ හැකි පරිදි ආධාර වියදම් සකස් කිරීමේ හා ආර්ථික වර්ධනය වේගවත් කළ හැකි පරිදි ධන මාර්ග යෙදවීමේ ප්‍රශ්නය සලකා බැලීමේ අවශ්‍යතාවය 1963 වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. විදේශීය සංචිත තිබෙන තෙක්, ප්‍රාසාරණාත්මකව, මුදල් ගෙන හිඟය පියවීමෙන් අතිරේක ඉල්ලුම පිරිමසාලීමට ආනයන ගලා එන නිසා (මෙයින් කොටසක් ආහාර ආධාර නිසා) අවශ්‍ය වෙයි සාමාන්‍ය මිල මට්ටම ඉහළ නොනගින බව, ඉන් පෙන්වා දෙන ලදී. සීමා,

කිරීමෙන් දැනට පවත්නා තත්ත්වය අනුව, ආනයන සැපැයුම සීමා කිරීමත් සමගම ප්‍රාසාරණාත්මකව හිඟය පියවීමෙන් සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි පීඩනයක් ඇතිවන්නේය. මෙවැනි අවස්ථාවකදී ආධාර මිල මගින්, පාරිභෝගික-යිනට ලැබෙන සහනය අනෙකුත් පාරිභොගික භාණ්ඩ වල මිල වැඩිවීම් නිසා මැකී යන්නේය.

මෑත වර්ෂවල ලංකාවේ අයවැය අත්දැකීම් වලින් පැහැදිලි වන තෙවැනි කාරණා නම් ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් ඇති, අසතුටුදායක තත්වයයි. ලංකාවේ සංවර්ධනය වේගවත් කරගැනිම සඳහා, හැම අයවැය ලේඛනයකින්ම ප්‍රාග්ධන වියදම් සඳහා සැලකිය යුතු ප්‍රතිපාදනයක් වෙන්කරන ලදී. එහෙත් මේ සෑම වර්ෂයකම නියම වියදම ප්‍රාග්ධන වැය සම්මතවලට වඩා ප්‍රමාණවත් අන්දමින් අඩුවිය. මෙය ප්‍රාග්ධන කටයුතු හා වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අඩුපාඩු හා දුබලකම් හෙළිකරන්නකි. මෙයින් පෙන්නුම් කැරෙන තවත් කාරණක් නම්, සංවර්ධන කටයුතු සඳහා රජයේ සංවිධානාත්මක හා පරිපාලන ශක්තීන් වහ වහා යෙදවීමේ අවශ්‍යතාවයයි. ක්‍රම සැළසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ඇති අඩුපාඩුව නිසා සංවර්ධන සැලැස්මවල් සඵල කර ගැනීමෙහි ලා බාධා ඇතිවීමෙන් හා විදේශාධාර ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම ප්‍රමාදවීමෙන් මුළු ආර්ථික වර්ධනයෙහිම ප්‍රවනතාවය අඩුවීමට පිළිවන.

**(ආ) වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට දුන් ණය**

1962 වසරේදී මෙන්ම 1964 දීද වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට (සංඛ්‍යා වෙන්කොට දැක්වීමට ඇති, දුෂ්කරතාවයන් නිසා රජයේ සමායතනද මෙයට ඇතුළත් වනසේ විග්‍රහකොට ඇත.) දුන් ණය, මුළු මූල්‍ය ප්‍රසාරණය කිරිමෙහි ලා සැලකි යුතු තැනක් ගෙන තිබේ. පසුගිය අවුරුදුවල වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට දුන් ණය වැඩිවීම් සාපේක්ෂක වශයෙන් (1962 දී රුපි. කෝටි 4·22 ක් හා 1961 දී රු. කෝටි 1 25ක්) සුළු විය. එහෙත් වඩාත් මෑත කාලයේදී ආනයන හා විනිමය සීමාකිරීමෙන් විදේශීය සංචිත ගලායෑම අඩුකිරීම නිසා බැංකු ක්‍රමයේ ද්‍රවශීලවත්කම් දියුණුවී වඩ වඩා ණයදීමේ හැකියාව ඇති විය. වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට දුන් ණය (අපනයන බිල් හැර) 1962 රුපියල් කෝටි 12·42 ක වැඩිවීම හා සසඳන කළ 1964 දී රු. කෝටි 11·17 කින් වැඩිවී ඇත. ඉහත සඳහන් කළ පරිදී, රජයේ ප්‍රසාරණාත්මක හිඟය මෑත කාලය තුළ සාමාන්‍ය වශයෙන් අඩුවන්නට විය. 1962/63 හා 1968/64 බදුවර්ෂවල එම හිඟයන් රු. කෝටි 16.0 ට ආසන්න ප්‍රමාණයන්හි පැවතිනි. මේ අනුව, රජයේ ප්‍රසාරණාත්මක හිඟයක් කපා හැරියද, වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට දෙන ලද ණය වැඩිවීම නිසා මුළු මූල්‍ය ප්‍රසාරණය ඉහළ මට්ටමක තබාලීමෙහි ලා ඉවහල් විය.

වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද ණය, වැඩිවූ අයුරු පහත සංඛ්‍යා සටහනෙහි පිඹුකොට දක්වා ඇත.

සංඛ්‍යා සටහන I - 4

**පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය**

රුපියල් දශ ලක්ෂ

| | 1963 දෙසැම්බර් | 1964 දෙසැම්බර් | වෙනස |
|---|---|---|---|
| (අ) එකතු කෙරිගෙන යන මුදල් ශීර්ෂ .. | 82·1 | 74·5 | —7·6 |
| (ආ) දේශීය බිල් (1) .. .. | — | — | — |
| (ඇ) ආනයන බිල් (1) .. .. | 65·8 | 77·8 | +12·0 |
| (ඈ) අපනයන බිල් .. .. | 72·8 | 53·6 | —19·2 |
| (ඉ) අයිරාවන් .. .. | 331·9 | 372·3 | +40·4 |
| (ඊ) ලෝන .. .. | 213·0 | 279·4 | +66·4 |
| එකතුව .. | 765·6 | 857·6 | +92·0 |

(1) 1963 වාර්ෂික වාර්තාවේ, මේ ශීර්ෂ සම්බන්ධයෙන් දී ඇති සංඛ්‍යා සංශෝධනය කොට ඇත.

1963 දී මෙන් 1964 දී ද වැඩිවූ වෙළෙඳ බැංකු ණය ප්‍රධාන වශයෙන් ම ගෙන ඇත්තේ ලෝන හා අයිරාවන් මගිනි.. වැඩි වූ අත්තිකාරම් මුළුමනින් ම ගෙන ඇත්තේ ලාංකික බැංකු වලිනි. ලාංකික බැංකු වලින් දෙන ලද මුළු අත්තිකාරම් රුපියල් කෝටි 12·08 කින් වැඩි වූ අතර, විදේශීය බැංකුවලින් දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 2·89 කින් අඩු විය.

වෙළෙඳ බැංකු, ඒ ඒ කරුණු අනුව දුන් අත්තිකාරම් පිළිබඳ විග්‍රහයක් මහබැංකුවේ අර්ධ වාර්ෂික සමීක්ෂණයෙහි දැක්වේ. 1963 හා 1964 වර්ෂවල ඒ ඒ කරුණු සඳහා දුන් අත්තිකාරම් වල ඇතිවූ වෙනස් කම් පහත එන සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන I – 5

**ඒ ඒ කරුණු අනුව දුන් අත්තිකාරම්**

රුපියල් දශ ලක්ෂ

| | 1963 දෙසැම්බර් | 1964 දෙසැම්බර් | වෙනස |
|---|---|---|---|
| වාණිජ .. .. | 451·6 | 488·2 | +36·6 |
| මූල්‍ය .. .. | 71·1 | 91·1 | +20·0 |
| කෘෂිකාර්මික .. .. | 25·7 | 28·9 | + 3·2 |
| කාර්මික .. .. | 43·4 | 72·1 | +28·7 |
| පාරිභෝජන .. . | 36·6 | 48·9 | +12·3 |
| අනෙකුත් ලෝන .. .. | 61·9 | 52·5 | — 9·4 |
| එකතුව .. | 690·4 | 781·7 | +91·3 |

ඉහත දැක්වූ පරිදි, වෙළෙඳ බැංකුවලින් දෙන ලද අත්තිකාරම් ප්‍රධාන වශයෙන් ම වැඩි වී ඇත්තේ, වාණිජ, මූල්‍ය හා කාර්මිකෘකටයුතු සම්බන්ධයෙනි. වාණිජ කටයුතු වෙනුවෙන් දෙන ලද අත්තිකාරම්, ප්‍රධාන වශයෙන් ම ආනයන වෙළෙඳම, තොග හා සිල්ලර වෙළෙඳම සඳහා දුන් අත්තිකාරම් විය. කාර්මික කටයුතු සඳහා දෙන ලද වැඩිවූ ණය වලින් රුපියල් කෝටි 1·05 ක්ම ගොඩනැගිලි හා ඉංජිනේරු කර්මාන්ත සඳහා වෙන් විය. සාමාන්‍ය වශයෙන් වුවද, පාරිභෝජන ණය ද වැඩි වී ඇත. එසේ වුවද, ඒ ඒ කරුණු අනුව වර්ග කැරුන බැංකු අත්තිකාරම් පිළිබඳ සංඛ්‍යාවල වෙනස්වීම් පරීක්ෂාවෙන් සලකා බැලිය යුතුය. 1963 වසරේ දී අනෙකුත් ලෝන යන වර්ගය යටතේ දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 5·03 කින් බොහෝ සෙයින් වැඩි විය. එහෙත් 1964 වසරේ දී මෙම ශීර්ෂය යටතේ වූ අත්තිකාරම් අඩු විය. වෙළෙඳ බැංකු විසින් ඒ ඒ කරුණු අනුව, දෙන ලද අනෙකුත් ශීර්ෂයන් යටතේ වූ අත්තිකාරම් වැඩි වූ අන්දම කෙතෙක් දුරට විග්‍රහාත්මක ලෙස දක්වා ඇත්දැයි තිරණය කිරීම උගහටය.

ණය ප්‍රසාරණයෙහි වේගය සීමා කිරීමේ පරමාර්ථයෙන් පනවනු ලදුව බලපවත්වමින් තුබුන විධිවිධාන කීපය 1964 වර්ෂය තුළ දී මහ බැංකුව විසින් තවදුරටත් පවත්වාගෙන යන ලදී. දැනට පවතින තත්වය අනුව අර්ථ ක්‍රමයේ නිෂ්පාදන අංශයන්හි ණය අවශ්‍යතා (සංවර්ධන කටයුතු කෙරීගෙන යද්දී මේ අවශ්‍යතාවයන් ද වැඩි විය හැකිය.) සපුරාලිය යුතු අතර, මෙම අවස්ථාවෙහි හැටියට අනවශ්‍ය කටයුතු සඳහා ණය වැඩිවීම නවතාලීමද, අවශ්‍යය. උද්ධමනාත්මක පීඩනයන් ඇති විට ඉදිරියට මිල වැඩි වෙතැයි යන අපේක්ෂාවෙන් තොග රඳවා ගැනීමට උනන්දුවක් ඇතිවන බැවින් විශේෂයෙන් සමපේක්ෂණ කටයුතු සඳහා ණය වැඩිවීම ගැන දැඩි පරීක්ෂාවකින් සිටිනු ලැබේ. එබැවින්

මෙහි දී මහ බැංකු ප්‍රතිපත්තිය දෙයාකාර වෙයි. පොදු මූල්‍ය තත්වය අනුව ණය ප්‍රසාරණය අධික නොවී වලක්වා ගැනීම සහ නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය කටයුතු සඳහා තෝරා ණය දීම හා සුදුසු ප්‍රදේශ වලට බැංකු පහසුකම් සැපැයීම මීට ඇතුලත් වේ. මෙකී පරමාර්ථයන් ඉටු කර ගැනීමෙහිලා අවශ්‍යවන තවත් විධිවිධානයන් ද මහ බැංකුව විසින් අවස්ථානුරූපව පනවනු ඇත.

(ඇ) මුදල් සැපැයුම

1964 දී ලංකාවේ මුළු මුදල් සැපැයුම රුපියල් කෝටි 11.58 කින් හෙවත් 7·7 කින් වැඩි විය. මෙයින්, රජයේ ගනුදෙනු වලින් හා වෙළෙඳ බැංකු විසින් පෞද්ගලික අංශයට ණය මවා දීමෙන් උද්ගත වූ ප්‍රසාරණාත්මක බලපෑම පිළිබඹු වෙයි. වර්ෂය තුල මුදල් සැපැයුම සැකසුනා අයුරු පහත සංඛ්‍යා සටහනෙහි වර්ග කොට දැක්වේ.

සංඛ්‍යා සටහන I – 6

**මුදල් සැපයුමෙහි වෙනස්වීම (1963 සිට 1964 කාලච්ඡේදයේ අවසානය)**

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| **ප්‍රාසාරණාත්මක සාධක** | |
| (අ) බැංකු ක්‍රමයෙන් රජය ගත් ණය .. .. .. | 104·6 |
| (ආ) වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දුන් ණය .. .. | 111·7 |
| (ඇ) බැංකු විදේශීය වත්කම් වල (ශුද්ධ) වැඩිවීම .. .. | 16·9 (අ) |
| එකතුව .. .. .. | 233·2 |
| **සංකෝචනාත්මක සාධක** | |
| (අ) කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම .. .. .. | 52·5 |
| (ආ) රජයේ මුදල් ශේෂ .. .. .. .. | 2·9 |
| (ඇ) වෙළෙඳ බැංකු වල අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. .. | 4·9 |
| (ඈ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) වැඩිවීම .. | 54·8 (ආ) |
| (ඉ) ගැලපිලි .. .. .. .. .. | 2·3 |
| එකතුව .. .. .. | 117·4 |
| මුදල් සැපැයුමෙහි ශුද්ධ වෙනස .. | +115·8 |

(අ) මහ බැංකුව 1964 පෙබරවාරි මස රජයේ ආයතන වලින් මිලට ගත් රුපියල් කෝටි 5·33 ක ප්‍රකාශිත වටිනාකමට වූ විදේශීය වත්කම් ඇතුළත් වේ. මෙම ගනුදෙනුව සඳහා ඉඩ හල විට වසර තුළ දී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) නියම වශයෙන් පහළ වැටී ඇත්තේ රුපියල් කෝටි 3·64 කිනි.

(ආ) රජයේ ආයතන වලට ඇති මහ බැංකුවේ අනෙකුත් වගකීම් වල වැඩිවිමෙන් මහ බැංකුව රජයේ ආයතන වලට නිකුත් කළ රුපියල් කෝටි 5·33 ක සුරැකුම්පත් ඇතුළත් වේ.

1963 අවසානයේ දී රුපි. කෝටි 150·66 ක්වූ මුළු මුදල් සැපැයුම (ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු ඇතුළුව) 1964 අවසානයේදී රුපි. කෝටි 162·18 ක් විය. එහෙත්, 1964 මුදල් සැපැයුමෙහි වැඩිවීම 1963 වැඩිවීමට වඩා අඩුවිය. 1963 දී මෙහි වැඩිවීම රු. කෝටි 16·33 ක් හෙවත් සියයට 12·2 ක්විය. 1964 ලින් වර්ෂය තුල රජය බැංකුවලින් ගත්, ණය ප්‍රමාණය හා වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට දුන් ණය ප්‍රමාණය 1963 දීට වඩා අඩුවිය. ඉහත සඳහන් කල පරිදි, මූල්‍ය ප්‍රාසාරණ තත්වය සාපේක්ෂක ඉහල මට්ටමක පැවැති අතර, 1964 මුදල් සැපැයුමෙහි වැඩිවීමේ වේගය, 1963 ට පෙරාතුව වූ වර්ෂවලදීට වඩා වැඩිවිය.

1962 හා 1963 වර්ෂවලදී මෙන් කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු සැලකිය යුතු ලෙස වැඩිවීමෙන් මුදල් සැපයුම කෙරෙහි ඇති අනෙකුත් ප්‍රාසාරණාත්මක සාධකයන්ගේ බලපෑම මැකී ගියේය. 1964 දී කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු රු. කෝටි 5·25 කින් වැඩිවිය. 1963 එය රු. කෝටි 6·34 කින් වැඩි වූ අතර, 1962 දී, රු. කෝටි 5·02 කින් වැඩිවිය. පසුගිය වාර්ෂික වාර්තාවේ දැක්වූ පරිදි, කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු වැඩිවීම මුදල් සැපයුමෙහි වැඩිවීම මකාලන සාධකයක් වුවද මෙම තැන්පතු සාපේක්ෂකව ද්‍රවශීල ස්වරූපයෙන් තබාගන්නා ලද වත්කම් වෙයි.

මෑත වර්ෂවලදී, මුදල් සැපයුමට ඇතුලත් ව්‍යවහාර මුදල්, සාපේක්ෂකව ඉල්ලුම් තැන්පතුවලට වඩා වැඩිවීමට පටන් ගෙන ඇත. මේ අනුව 1963 මුළු මුදල් සැපයුමෙහි වැඩිවීමෙන් සියයට 71 ක්ම ව්‍යවහාර මුදල්වලින් සමන්විත විය. එහෙත් 1964 දී මේ හැඩගැස්ම සැලකිය යුතු අන්දමින් වෙනස් වී ඇත. එම වසරේ ව්‍යවහාර මුදල් වැඩිවීම වැඩිවූ මුදල් සැපයුමෙන් සියයට 21 ක්වූ අතර, ඉල්ලුම්

තැන්පතු වැඩිවීම සියයට 79 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුදල් සැපයුම්ට වූ ව්‍යවහාර මුදල් අනුපාතය, 1963 සියයට 55 සිට 1964 දී සියයට 52·6 දක්වා පහළ වැටිණි. ඉල්ලුම් තැන්පතුවලට වඩා අඩු වේගයකින් ව්‍යවහාර මුදල් වැඩිවීමත් සමග විවිධ වටිනාකම්වලට අයත් මුදල් නෝට්ටුවල සැකැස්මෙහි ද වෙනස්කමක් ඇතිවිය. මෑත වර්ෂවලදී රුපි. 100 හා රු. 50/- නෝට්ටු භාවිතය සැලකිය යුතු ලෙස වැඩිවිය. එහෙත් 1964 මැයි හා සැප්තැම්බර් අතර කාලයතුළ රුපි. 100 නෝට්ටු කෝටි 29·80 සිට රුපි. කෝටි 17·02 දක්වා අඩුවිය. එහෙත් රුපි. 10 නෝට්ටු රුපි. කෝටි 25·74 සිට රුපි. කෝටි 33·58 දක්වා වැඩිවිය. රුපියල් 100 නෝට්ටුව අවලංගු කරනැයි බලාපොරොත්තුවත් වැඩි වටිනාකම් ඇති මුදල් නෝට්ටු සඟවා තබා ගැනීමාදී ක්‍රමවලින් බදු නොගෙවා සිටීම නවතාලීමට ගෙන ආ අයවැය විධිවිධානත් හේතුකොට ගෙන මෙම වෙනස්කම් ඇතිවූයේ යැයි සැලකිය හැකිය.

## (4) 1964 විදේශීය ගෙවුම්

මේ කොටසේ දෙවැනි ඡේදයේ, ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය පිළිබඳ දිගු කාලීන හැඩගැස්ම හා ලංකාවට මේ සම්බන්ධයෙන් මුහුණපෑමට ඇති මූලික ප්‍රශ්න ගැන ලුහුඬින් කරුණු දැක්වෙයි. 1964 ගෙවුම් ශේෂ තත්ත්වයෙන්, තොයාකාරයක හැඩගැසීමක් හා ප්‍රශ්න තුනක්, මැනවින් විදහා දැක්වෙයි. ශේෂ තත්ත්වය පිළිබඳ සවිස්තර සටහනක් මෙම වාර්තාවේ II වැනි කොටසේ එයි.

1964 වසරේ ලංකාවේ විදේශීය ගිණුම් වලට අදාල සම්පිණ්ඩනයන් කීපයක් පසුගිය වසර කීපය හා සසඳ පහත එන සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

සංඛ්‍යා සටහන I – 7

**1960 / 1964 ලංකාවේ ගෙවුම් ශේෂය**

රුපියල් දශ ලක්ෂ

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 (තාවකාලිකයි) |
|---|---|---|---|---|---|
| 1. වෙළෙඳ භාණ්ඩ .. | | | | | |
| අපනයන .. | +1796 | +1707 | +1763 | +1708 | +1764 |
| ආනයන .. | —2006 | —1794 | —1906 | —1869 | —1957 |
| වෙළෙඳ ශේෂය .. | — 210 | — 87 | — 143 | — 161 | — 193 |
| 2. සේවා .. | — 32 | — 18 | — 4 | — 20 | + 6 |
| 3. පරිත්‍යාග .. | + 22 | + 11 | + 7 | + 13 | + 40 |
| 4. වර්තන ගිණුම් ශේෂය .. | — 220 | — 94 | — 140 | — 168 | — 148 |
| **මුදල් ලබාගත් ක්‍රමය** | | | | | |
| 5. පෞද්ගලික ප්‍රාග්ධනය .. | | | | | |
| දිගු කාලීන .. | + 2 | — 8 | — 2 | + 5 | — 2 |
| කෙටි කාලීන (1) .. | — 7 | + 14 | — | — 4 | — 13 |
| 6. රජයේ හා බැංකු ප්‍රාග්ධනය | | | | | |
| (i) දිගුකාලීන විදේශීය වගකීම් වල (ශුද්ධ) වෙනස්වීම් .. | + 20 | + 19 | + 40 | + 75 | + 7 |
| (ii) කෙටිකාලීන විදේශීය වගකීම් වල (ශුද්ධ) වෙනස්වීම | — 17 | + 81 | + 44 | + 46 | + 54 |
| (iii) විදේශීය වත්කම් වල .. | + 193 | + 10 | + 28 | + 42 | + 111 |
| (iv) අනෙකුත් .. | — | — 2 | — | — | — |
| 7. වැරදීම් හා අත්හැරීම් .. | + 29 | — 19 | + 31 | + 4 | — 9 |

(1) ධන ලකුණින් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම හෝ දැක්වේ.

ඉහත සඳහන් පරිදි, ලැබීම් ලැබීම් හා ගෙවීම් සංඛ්‍යාවලට අනුව 1964 දී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය 1963 දීට වඩා වැඩි විය. වසර තුළ දී අපනයන වලින් ලද ආදායම හා ආනයන සඳහා වූ වියදම ඉහළ ගියේ ය. 1964 දී පොල් හා රබර් අපනයන පරිමාවන් විශාල ලෙස වැඩි වූ නිසා අපනයන ඉපැයුම් වැඩි විය. 1964 දී තේ අපනයන මඳ වශයෙන් අඩුවිය. සියලු අපනයන සඳහා වූ සමාන්‍ය මිල දර්ශකය වසර තුළ නොවෙනස්ව පැවතිණි. වැඩි වූ අපනයන ඉපැයුම්

ආනයන වියදම් වැඩිවීම නිසා පමණටත් වඩා මැකී ගියේ ය. වසර තුළ රෙදි පිළි ආනයන පරිමාව විශේෂයෙන් ම වැඩි වූ අතර, සහල් පිටි හා සීනි සඳහා වූ වියදම ද වැඩි විය. මෙයට හේතු වූයේ ලෝක වෙළෙඳ පොලේ මේ භාණ්ඩවල මිල වැඩිවීමය. එසේ ම වෙනත් පාරිභෝගික භාණ්ඩ හා අන්තර් භාණ්ඩ කිහිපයක ද ආනයන පරිමාවන් වැඩි වූ බව රේගු සංඛ්‍යා තොරතුරු වලින් දැක්වෙයි. ආයෝජන භාණ්ඩ ආනයනය ද සුළු වශයෙන් අඩු විය. මෙයට මුළුමනින් ම හේතු වී ඇත්තේ, රථවාහන උපකරණ ගෙන්වීම අඩුවීමය. ගෙවුම් ශේෂ ගිණුම් හි සටහන් ව ඇති මුළු වෙළෙඳ භාණ්ඩ ආනයන වටිනාකමෙන් කොටසක් ද්‍රව්‍ය වලින් කැරුන පරිත්‍යාග වලින් (ප්‍රධාන වශයෙන් ම,එක්සත් ජනපදයෙන් ලැබුන ඇඳිහැස පිටි හා කිරි සහ චීනයෙන් ලැබුන රෙදිපිළි හා කැනඩාවෙන් ලැබුන ආධාර) සමන්-විතය.

වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වැඩි වුව ද, 1963 දී රුපියල් කෝටි 2.0 ක හිඟයක් ඇති වූ සේවා ගිණුමෙහි රුපියල් කෝටි 0·6 ක අතිරික්තයක් ඇති වීමෙන් එය සුළු වශයෙන් මැකී ගියේ ය. මෙසේ වූයේ ලාභ හා ලාභාංශ සඳහා කල් දීමේ බලය 1964 අගෝස්තු මාසයේ දී පනවනු ලැබීමෙන් පසු ආයෝජන ආදායම පිළිබඳ වූ හිඟය, අඩුවීම හේතුකොට ගෙනය. වෙළෙඳ භාණ්ඩ ගිණුම් හිඟය ද 'පරිත්‍යාග' යටතේ වූ ශීර්ෂයෙහි අතිරික්තයක් ඇතිවීම නිසා තරමක් දුරට මැකී ගියේ ය. මෙම ශීර්ෂවලට පෞද්ගලික ප්‍රේෂණ වල හා සංක්‍රමිකයන්ගේ මුදල් ගෙනයාමේ ශේෂද (ශුද්ධ) පරිත්‍යාග ද ඇතුළත් වේ. ඉහත සඳහන් කළ නිල පරිත්‍යාග (එනම්, ද්‍රව්‍ය වලින් දෙන ලද දීමනා) 1963 රුපියල් කෝටි 4·36 සිට 1964 දී රුපියල් කෝටි 7·64 දක්වා වැඩි විය. අදිසි ගිණුම් ශේෂය යහපත්වීමේ හේතුවෙන් 1964 දී ලංකාවේ ජංගම ගිණුම් ශේෂයෙහි ඇති වූ හිඟය 1963 දීට වඩා අඩු විය. 1963 දී ජංගම ගිණුමෙහි රුපියල් කෝටි 16·8 ක හිඟයක් ඇති වූ අතර, 1964 දී ඇති වූ හිඟය රුපියල් කෝටි 14·8 ක් විය.

ඉහත සංඛ්‍යා සටහනින් ජංගම ගිණුම් ශේෂය පියවාගත් අයුරු ද දැක්වේ. බොහෝ සෙයින් කෙටි කාලීන පෞද්ගලික ප්‍රාග්ධන රුපියල් කෝටි 1·5 ක් (ශුඩ) රටින් පිටව ගොස් ඇත. ඉතිරි ජංගම ගිණුම් හිඟය නිල හා බැංකු ප්‍රාග්ධන එනම්, විදේශීය වත්කම් අඩුකර ගැනීමෙන් හා විදේශීය වගකීම වැඩි කර ගැනීමෙන් පියවා ගන්නා ලදී. 1964 දී විදේශීය වත්කම් රුපියල් කෝටි 5·10 කින් අඩු විය. මෙයට නිදන් අරමුදල් මාර්ගයෙන් ගෙවන ලද රුපියල් කෝටි 6·0 ක රන් පවුම් ණය ඇතුළත් නොවේ. ජංගම ගිණුම් හිඟය පියවීම සඳහා දිගු කාලීන වගකීම්, එනම්, දිගු කාලීන වශයෙන් ගත් ණය රුපියල් කෝටි 6·60 ක් විය. එහෙත්, ගෙවන ලද රන් පවුම් ණය ගණනට ගත් පසු විදේශීය වගකීම් වැඩිවී ඇත්තේ රුපියල් කෝටි ·7 කින් පමණෙකි. ජංගම ගිණුම් ශීර්ෂයේ රුපියල් කෝටි 5·4 ක්, රජයේ කෙටි කාලීන වගකීම් වැඩි කර ගැනීමෙන් පියවා ගන්නා ලදී. මේවා ප්‍රධාන වශයෙන් ම ලංකාවෙන් ගෙවිය යුතු ගෙවීම් ගිවිසුම් ශේෂ හා රජයේ සහල් ආනයන වෙනුවෙන් කල් තුබූ ගෙවීම් වලින් සමන්විතය.

විදේශීය සංචිත තවදුරටත් අඩුවීම හා රජයේ කෙටි කාලීන වගකීම් වැඩිවීම අවශ්‍යයෙන් ම සැලකිලිමත් විය යුතු කරුණෙකි. 1964 අවසානය වන විට, ලංකාවේ මුළු විදේශීය වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් හැර) රුපියල් කෝටි 30·47 ක්ව තිබිණි. මේ මුදලින් රුපියල් කෝටි 13·59 ක් මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය විය. ජාත්‍යන්තර සංචිතයේ ද්‍රවශීල ශේෂය රුපියල් කෝටි 4·97 ක් විය, ඉතිරිය ප්‍රධාන වශයෙන් ම විදේශීය සුරැකුම්පත් වලින් සමන්විතය. අපනයන කාරක ශේෂ වලින් සැදුන වෙළෙඳ බැංකුවල විදේශීය ශේෂය මුළු විදේශීය වත්කම් වලින් රුපියල් කෝටි 10·73 ක් විය.

ඉහත කොටසක, සාකච්ඡාකළ පරිදි, වෙළෙඳ අනුපාතය අවාසි සහගත වීමත් අපනයන වර්ධනය ශීඝ්‍ර නොවීමත් සංවර්ධනය වෙමින් පවත්නා රටවල විදේශීය ගෙවුම් ගිණුම් කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරයි. වැඩි වන ආනයන අවශ්‍යතා හා සංචිත සෑහෙන ප්‍රමාණයක් නොතිබීම නිසා සංවර්ධනය වෙමින් තිබෙන රටවල ආර්ථික කටයුතු අඩාල නොවී පවත්වාගෙන යාමට සහ සංවර්ධනය වේගවත් කිරීමට, වැඩි වැඩියෙන් කෙටි කාලීනව හා දිගු කාලීනව, විදේශ වලින් ධනය ලබා ගැණීමට සිදු වේ. ලංකාව මේ ප්‍රශ්න වලට දැනටමත් බොහෝ සෙයින් මුහුණපා ඇත. ලංකාවේ ගෙවීම් ප්‍රශ්නය නිරාකරණය සඳහා ලංකාවට ගලා එන විදේශීය ධන මාර්ග වැඩි දියුණු කළ යුතුව ඇත. එවැනි ධන මාර්ග ලබා ගැනීමට හැකි වුවහොත් ඉදිරි වර්ෂ වල දී ගෙවුම් ශේෂ තත්වය ශක්තිමත් වන අයුරින්, මූල්‍ය හා බදු ක්ෂෙත්‍රයෙහි උචිත ප්‍රතිපත්ති ඇති කොට, වැඩදායී සංවර්ධන වැඩ පිළිවෙළ සඳහා ඒ උපයෝගී කොට ගත යුතුය. කෙටි කාලීන වශයෙන් ගත් විදේශීය ණය එකතු වීම විශේෂයෙන් වාසි සහගත නොවන කොන්දේසි උඩ, භාණ්ඩ සපයන්නන්ගෙන් ගත් ණය, සුදුසු ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලක් නොමැතිව, යෙදුවහොත්, තාවකාලික සහනයක් ලැබුන ද අනාගතයේ දී ඉන් බරපතල බරක් ඇතිවන්නට පිළිවන. වෙනත් දියුණු වෙමින් තිබෙන රටවල් හා සසඳන විට, දැනට ලංකාවේ විදේශීය වගකීම් එතරම් නැත. එහෙත් ලංකාවේ ගෙවීම් දුෂ්කරතා නිසා නුසුදුසු අයුරේ විදේශීය ණය නොගැනීමට ලංකාව ප්‍රවේසම් විය යුතුය.

## (5) නිගමනය

ලංකාවේ අර්ථ ක්‍රමයට මුහුණ දීමට ඇති සමහර ප්‍රශ්න ඉහත පිටු වලින් විග්‍රහ කොට ඇත. එසේ ම ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය පිළිබඳ වූ දිගු කාලීන වූ ද, වඩා මූලික වූ ද හැඩ ගැසීම් සමහරක් එහි විස්තර කරන ලදී. තව ද, මෑත කාලයේ අය බදු හා මූල්‍ය ප්‍රාසාරණය හේතු කොටගෙන මෙරට ඇති වූ මූල්‍ය අසමතුලිතතාවය ද පෙන්නුම් කර දී ඇත. ලංකාව මේ අවස්ථාවේ දී ප්‍රධාන අරමුණු තුනක් සඳහා සිය අවධානය යොමු කළ යුතුය. එය, ඉල්ලුම හා සැපැයුම අතර ඇති මූල්‍ය අසමතුලිතතාවය අඩු කළ යුතුය. මේ අරමුණ සඳහා ම ලංකාව සිය ඉතිරි කිරීම් වැඩිකිරීමෙන් හා පාරිභෝජන වැය සීමා කිරීමෙන්, වැඩි වන ධන සම්පත් සංවර්ධනය සඳහා යෙදවිය යුතුය. එසේ ම අව ම ආනයන අවශ්‍යතාවය හා අපනයන ඉපැයුම් අතර, ඇති පරතරය පියවනු සඳහා විදේශීය ධන සම්පත් වැඩි වැඩියෙන් ගලා ඒමට සැලැස්විය යුතුය. මෙකී අරමුණු අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධව විදේශීය ධනය වැඩි වැඩියෙන් ගලා ඒමෙන් සැපැයුම් පරිමාව වැඩිවීම නිසා මූල්‍ය අසම තුලිතතාවය අඩු කර ගත හැකිය. මූල්‍ය අසමතුලිතතාවය අඩුවීම නිසා ස්ථාවර මූල්‍ය තත්ත්වයක් ඇතිවීමෙන් වැඩි වැඩියෙන් විදේශීය ධන සම්පත් ගලා ඒමට පටන් ගනී. මේ අතර, රට තුළ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වැඩි ප්‍රයත්නයක් දැරීමෙන්, රට තුළ අර්ථ ක්‍රමයෙහි ඇති පීඩාව මග ඇරෙන අතර, විදේශාධාර ප්‍රයෝජනවත් ලෙස උපයෝගී කර ගැනීමේ හැකියාව ලැබේ මූල්‍ය ප්‍රාසාරණය අඩු කිරීමෙන් පමණක් ලංකාවේ ප්‍රශ්න නිරාකරණය කළ හැක්කේ නොවේ. හීන සංවර්ධන ප්‍රවනතාවයක් ඇති විටෙක මූල්‍ය සමතුලිතතාවය හෝ ආනයන මට්ටම අඩුව ඇති විට, විදේශීය ගෙවීම් සමතුලිතතාවයක් ඇති කිරීම ලංකාවේ හෝ සංවර්ධනය වෙමින් පවත්නා වෙනත් රටක හෝ පරමාර්ථයන් නොවිය යුතුය. අවශ්‍ය වී ඇත්තේ ආර්ථික වර්ධනය අළුත් උද්යෝගයකින් වර්ධනය කිරීම සඳහා මූල්‍ය ස්ථිරතාවය හා සමතුලිත තාවයයි.